Occupational Diversity, Multiculturalism, and Social Change

Weerakoon, U.

Abstract

The research on Occupational Diversity, Multiculturalism, and Social Change is to examine the historical relationships, social coexistence, cultural interactions, and economic activities of the Sinhala and Muslim communities in the Udunuwara and Yatinuwara (Denuwara) areas of the Kandy District. Particular attention is given to how ethnic relationships developed in the Denuwara region, their historical foundations, and the ways in which these relationships have been transformed in response to contemporary social, economic, and educational changes. The study draws on historical documents, published research and literature, local administrative statistics, census reports, and qualitative data obtained through interviews. The findings reveal that the presence of the Muslim community in the Denuwara region dates to the distant past, including the Kandyan period. Trade, indigenous medicine, royal service, and marriage ties have contributed to the community's long-standing settlement in the region. Information regarding Muslim medical practitioner lineages in the Eladetta–Leemagahakotuwa and Daskara areas highlights the transmission of traditional medical knowledge across generations, occupational identity, and longstanding relationships with Sinhala society. Furthermore, mutual assistance, participation in festivals, food sharing, and family ties between the Sinhala and Muslim communities in the past contributed to social coexistence. However, there are emerging trends indicating a weakening of traditional intercommunal relationships due to the politicisation of ethnic differences, increasing economic pressures, and differences in attitudes between generations. In the field of education, Sinhala-medium schools, libraries, and language use have contributed

to building relationships between ethnic communities. An examination of changes in employment structures in Denuwara and local industries and caste-based relationships in Udunuwara also highlights the connections between occupational heritage, social stratification, and modern occupational mobility. Overall, this study reveals that the social history of the Denuwara region has been shaped not merely by ethnic identities but also by shared history, occupational relationships, language, education, and everyday social interactions.

Keywords: Caste Relations, Indigenous Medicine, Occupational Heritage, Sinhala–Muslim Relations, Social Coexistence

වෘත්තීය විවිධත්වය, බහුසංස්කෘතිකත්වය සහ සමාජ වෙනස්වීම

සංක්ෂේපය

වෘත්තීය විවිධත්වය, බහුසංස්කෘතිකත්වය සහ සමාජ වෙනස්වීම පිළිබඳ මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර හා යටිනුවර (දෙනුවර) ප්‍රදේශය ආශ්‍රිත සිංහල හා මුස්ලිම් ප්‍රජාවන්ගේ ඓතිහාසික සම්බන්ධතා, සමාජ සහජීවනය, සංස්කෘතික අන්තර්ක්‍රියා සහ ආර්ථික ක්‍රියාකාරකම් විමර්ශනය කිරීමයි. විශේෂයෙන්ම දෙනුවර ප්‍රදේශවල ජනවාර්ගික සම්බන්ධතා ගොඩනැගුණු ආකාරය, ඒවායේ ඓතිහාසික පදනම සහ සමකාලීන සමාජ, ආර්ථික හා අධ්‍යාපනික වෙනස්කම් හමුවේ එම සම්බන්ධතා පරිවර්තනය වන ආකාරය මෙහිදී අවධානයට ලක් කෙරේ. අධ්‍යයනය සඳහා ඓතිහාසික ලේඛන, ප්‍රකාශිත පර්යේෂණ හා ග්‍රන්ථ, ප්‍රාදේශීය කාර්යාලයීය සංඛ්‍යාලේඛන හා ජන සංගණන වාර්තා සහ සම්මුඛ සාකච්ඡා මඟින් ලබාගත් ගුණාත්මක දත්ත භාවිත කර ඇත. අධ්‍යයනයෙන් අනාවරණය වන්නේ දෙනුවර ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවගේ පැවැත්ම මහනුවර යුගය ඇතුළු ඈත අතීතයට සම්බන්ධ වන බවත් වෙළෙඳාම, දේශීය වෙදකම, රාජකීය සේවය සහ විවාහ සබඳතා ඔවුන්ගේ ප්‍රාදේශීය ස්ථාපිතභාවයට දායක වී ඇති බවත්ය. විශේෂයෙන්ම එළදැත්ත-ලීමගහකොටුව සහ දස්කර ප්‍රදේශවල මුස්ලිම් වෙද පරම්පරාවන් පිළිබඳ තොරතුරු මඟින් පරම්පරාගත වෛද්‍ය දැනුම, වෘත්තීය අනන්‍යතාව සහ සිංහල සමාජය සමඟ සමීප සම්බන්ධතා පැවතිණි. එසේම සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර අතීතයේ පැවති අන්‍යෝන්‍ය සහයෝගය, උත්සව අවස්ථා සහභාගීත්වය, ආහාර හුවමාරුව සහ පවුල්මය සබඳතා සමාජ සහජීවනය සඳහා ඉවහල් වී තිබේ. තවද දේශපාලනීකරණය වූ ජනවාර්ගික වෙනස්කම්, ආර්ථික කාර්යබහුලත්වය සහ පරම්පරා අතර ආකල්පමය වෙනස්කම් හේතුවෙන් සාම්ප්‍රදායික අන්තර්ප්‍රජා සම්බන්ධතා දුර්වල වීමේ ප්‍රවණතා පැහැනැගී තිබේ. අධ්‍යාපන ක්ෂේත්‍රයේදී සිංහල මාධ්‍ය පාසල්, පුස්තකාල සහ භාෂා භාවිතය ජනවාර්ගික ප්‍රජාව අතර සම්බන්ධතා ගොඩනැගීමට ඉවහල් වී ඇත. දෙනුවර රැකියා ව්‍යුහයන්හි වෙනස්කම් සහ උඩුනුවර දේශීය කර්මාන්ත හා කුල සම්බන්ධතා විමර්ශනය තුළදී වෘත්තීය උරුමය, සමාජ ස්ථිරීකරණය සහ නවීන වෘත්තීය සංචලනය අතර පවතින සම්බන්ධතාව පවතී. සමස්තයක් ලෙස දෙනුවර ප්‍රදේශයේ සමාජ ඉතිහාසය ජනවාර්ගික අනන්‍යතා පමණක් පදනම් කරගෙන නොව හවුල් ඉතිහාසය,

වෘත්තීය සම්බන්ධතා, භාෂාව, අධ්‍යාපනය සහ දෛනික සමාජ අන්තර්ක්‍රියා ඔස්සේ ක්‍රියාත්මක වන බව මෙම අධ්‍යයනයෙන් අනාවරණය වෙයි.

ප්‍රමුඛ පද- කුල සම්බන්ධතා, දේශීය වෙදකම, වෘත්තීය උරුමය, සමාජ සහජීවනය, සිංහල-මුස්ලිම් සම්බන්ධතා

1. හැඳින්වීම

ශ්‍රී ලංකාව පළාත් නවයකට බෙදා ඇති අතර සෑම පළාතක්ම පරිපාලන දිස්ත්‍රික්ක කිහිපයකින් සමන්විත වේ. සෑම පරිපාලන දිස්ත්‍රික්කයක්ම තවදුරටත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට බෙදා ඇත. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස නැවත ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට බෙදා වෙන් කර ඇති අතර, ග්‍රාම නිලධාරී කොට්ඨාස රටේ කුඩාම පරිපාලන ඒකක ලෙස ක්‍රියාත්මක වේ. ඒ අනුව ශ්‍රී ලංකාව පරිපාලන දිස්ත්‍රික්ක 25කින් සමන්විත වන අතර මේ වන විට ක්‍රියාත්මක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව 340කි. 2012 වසරේ පැවති ජන හා නිවාස සංගණනයේදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 331ක් වාර්තා වී තිබුණි. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක්ම තවදුරටත් ග්‍රාම නිලධාරී කොට්ඨාසවලට බෙදා පරිපාලනය කරනු ලබන අතර, 2012 ජන හා නිවාස සංගණනය පැවැති අවස්ථාවේදී ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව 14,021ක් විය. කෙසේ වෙතත්, ඉන් අනතුරුව රට තුළ ක්‍රියාත්මක වූ විවිධ සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් භූමියේ සිදු වූ වෙනස්කම් සැලකිල්ලට ගනිමින් මෙම සංඛ්‍යාව සංශෝධනය කර ඇත. ඒ අනුව මේ වන විට රට තුළ ක්‍රියාත්මක ග්‍රාම නිලධාරී කොට්ඨාස සංඛ්‍යාව 14,008ක් වේ (Department of Census and Statistics, 2024,p.29).

ශ්‍රී ලංකාවේ වර්තමාන ජනගහනය 21,781,800 ක් වේ. ජනවර්ගය අනුව එහි ව්‍යාප්තිය පළාත් අනුව බලන විට සිංහල ජනගහනය දකුණු පළාතේ (94.8%), උතුරු මැද පළාතේ (90.5%), සබරගමුව පළාතේ (86.5%), වයඹ පළාතේ (84.8%) සහ බස්නාහිර පළාතේ (83.6%) ක් වේ. උතුරු පළාතේ ශ්‍රී ලංකා දෙමළ ජනවර්ගය ප්‍රධාන වන අතර එහි ප්‍රතිශතය 91.5% කි. එසේම ශ්‍රී ලංකා දෙමළ ජනයා නැගෙනහිර පළාතේ (38.1%) සහ මධ්‍යම පළාතේ (8.3%) ක් ලෙස දක්නට ලැබේ. ඉන්දියානු දෙමළ/මලයග තමිලර් ජනවර්ගයට අයිති ජනතාව මධ්‍යම පළාතේ (15%) ක් ද ඌව පළාතේ (6.9%) සහ සබරගමුව පළාතේ (2.2%) ක් ද ලෙස වාසය කරති. මුස්ලිම් ජනවර්.ය නැගෙනහිර පළාතේ විශාලතම ජනවාර්ගික කණ්ඩායම වන අතර එහි ප්‍රතිශතය 39.5% කි. එමෙන්ම වයඹ පළාතේ (12.2%), මධ්‍යම පළාතේ (10.7%) සහ බස්නාහිර පළාතේ (8.9%) ද වශයෙන් වාසය කරති. බර්ගර්, මැලේ, ශ්‍රී ලංකා චෙට්ටි, භාරත සහ වැදි යන ජනවාර්ගික කණ්ඩායම් ඇතුළු අනෙකුත් ජනවාර්ගික කණ්ඩායම්වල එකතුව, බස්නාහිර පළාත හැර අනෙකුත් සියලුම පළාත්වල සියයට 0.4කට වඩා අඩු ප්‍රතිශතයක් ලෙස පවතී (Department of Census and Statistic, 2025,p.95).

ශ්‍රී ලංකාවේ ජනවර්ග අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා පිළිබඳ ඓතිහාසික තොරතුරු පවතී. සිංහල, දෙමළ ජන සම්බන්ධය බලන විට එය පුරාණ කාලයේ සිටම ශ්‍රී ලංකාව සහ දකුණු ඉන්දියාව අතර භූගෝලීය සමීපතාව මත පදනම් වූ වෙළෙඳ, සංස්කෘතික හා දේශපාලන සබඳතා වල බලපෑම ශිලා ලේඛන හා පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින් දැකගත හැකිය. විශේෂයෙන් දකුණු ඉන්දීය වෙළෙඳ ප්‍රජාවන් ශ්‍රී ලංකාවේ වෙළෙඳ කටයුතුවල නිරත වූ බව දෙමළ ශිලා ලේඛන මඟින් හෙළි වේ (Nanayakkara, 2021,pp.168-176). සිංහල හා දෙමළ භාෂා අතර දීර්ඝකාලීන සම්බන්ධතාව හේතුවෙන් සිංහල භාෂාවට දෙමළ භාෂාවෙන් වචන ගණනාවක් ඇතුළත් වී ඇති අතර, එම ණය වචන වෙළෙඳාම, පරිපාලනය, ආහාර, ශාක හා දෛනික ජීවිතය වැනි විවිධ ක්ෂේත්‍රවල දක්නට ලැබේ (Ansaldo, 2017,pp.575-585).

එමෙන්ම සිංහල සහ මුස්ලිම් ජනතාව අතර සමීප සම්බන්ධතාවක් අතීතයේ පැවති බවට තොරතුරු අනාවරණය වේ. මුස්ලිම්වරුන්ට වසර දහසක පමණ සාමකාමී ඉතිහාසයක් මෙරට භූමියේ පවතින බවත් ඔවුහු බෞද්ධ ජනතාව සමඟ හොඳින් සම්බන්ධ වී කටයුතු කිරීමට සමත් වී ඇති බවත් සඳහන් වේ. එසේම මුස්ලිම්වරුන්ට සම්ප්‍රදායික බෞද්ධ පවුල්වල නම් කිහිපයක් ඇති බවත් එමගින් වර්තමාන මුස්ලිම්වරුන්ගේ පවුල් මූලයන් ගම්‍ය වන බවත් දක්වයි. ඒ අතරම මුස්ලිම්වරුන් ඔවුන්ගේ ආගමික පෞරුෂය ඉස්ලාමීය නාමයන් දක්වා ආරක්ෂා කරගත් අතර ඊට ඔවුන්ගේ ඥාති මූලයන් වැදගත් වී තිබේ. චංචල හා නිශ්චල දේපලවල සම්භවය හා හිමිකාරිත්වය සම්බන්ධ ඔවුන්ගේ නීතිමය ලියකියවිලි වල සිංහල නම් භාවිත කර ඇත (Dewaraja, 1994,pp.17-18).

පෘතුගීසීන් ශ්‍රී ලංකාවට මුලින්ම පැමිණියේ 1505 දී ලෝරෙන්සෝ ද අල්මේදාගේ නායකත්වයෙන ඔවුන් පසුව ලංකාව අල්ලා ගැනීමෙන් පසුව ඔවුන්ගේ කතෝලික ආගම ප්‍රචාරය කිරීම සහ කුළුබඩු අත්පත් කර ගැනීම කෙරෙහි අවධානය යොමු කළහ. ආගම හා වෙළඳාම යන දෙඅංශයෙන්ම ඔවුන්ට මුස්ලිම්වරු අභියෝගයක් වූ බැවින් මුස්ලිම්වරුන්ට හානි කිරීමට එය හේතුවිය. මේ තත්ත්වය ලන්දේසීන් විසින් ද නොනවත්වා සිදුකළ බැවින් මුස්ලිම්වරු උඩරට ප්‍රදේශයට සංක්‍රමණය වීමට මෙය හේතුවිය. මෙහිදී රට පාලනය කළ සෙනරත් (1604-1635) සහ දෙවන රාජසිංහ (1635-1687) විසින් මුස්ලිම්වරුන් නැඟෙනහිර ඉවුරේ පදිංචි කරවීමට ක්‍රියා කළහ. සෙනරත් රජු විසින් වි වගාව නැවත පණ ගැන්වීම සඳහා මඩකලපුව ප්‍රදේශයේ හා දීඝවාපි

ප්‍රදේශයේ මුස්ලිම්වරු මෙන්ම දමිළ ජනතාව විශාල පිරිසක් පදිංචි කරවීය (Dewaraja, 1994,pp.85-86).

අතීතයේ මෙරට සිංහල ඇතුලු අනෙකුත් ජන සමුහයා විසින් මුස්ලිම් ජනතාව පිළිගැනීම ජනවාර්ගික සහයෝගය පිණිස ඉවහල් විය. උඩරට රජුගේ පාලනයට අදාල හඳුනාගත් රාජකාරි කටයුතු මුස්ලිම්වරුන්ට පැවරීම මගින් ඔවුන් ජනතාව අතරට එකතු විය. උඩරට පාලනය විසින් සහ එහි ජනතාව විසින් මුස්ලිම්වරුන් පිළිගනු ලැබීය. ඔවුන් සමාජයේ සෙසු ජනයා සමඟ සාමුහිකව කටයුතු කිරීමට මුල්වුයේ රජුගේ පාලනයෙන් හදුන්වා දුන් රාජකාරි කාර්යයන් මුස්ලිම්වරුන්ට පැවරීම මඟිනි. පුවක් ව්‍යාපාර (arecanut business) කටයුතු මුස්ලිම්වරුන්ට පවරනු ලැබීය. ලුණු ලේවාය ආසන්නයේ සිටි උඟව ප්‍රදේශයේ මුස්ලිම් ජනතාවට දළදා මාළිගාව, විහාර හා දේවාල වලට ලුණු සැපයීම අනිවාර්ය රාජකාරියක් ලෙස රජු විසින් පවරනු ලැබීය. මෙහිදී තෝරාගත් මුස්ලිම්වරුන්ට මාළිගාවේ ඉඩම් පදිංචිය සඳහා ලබා දෙන ලදී. මුස්ලිම්වරුන්ගේ රාජකාරි සේවාවන් ඉදිරියට පවත්වාගෙන යාම 'කාරියකරවනරාළ' විසින් සිදුකරනු ලැබීය. දළදා මාළිගාවේ පරිපාලන හා පුජනීය කටයුතුවලට මුස්ලිම්වරුන් මුළුමනින්ම සම්බන්ධ නොවුනත් එහි යම් යම් සේවාවලට ඔවුන්ගේ මැදිහත්වීම සිදුවිය. එසේම මුස්ලිම්වරු රෙදි වියන්නන්, බාබර්වරුන්, ලැපිඩාර්වරුන් සහ මැහුම්කරුවන් ලෙසද සේවය කළහ (Dewaraja, 1994,pp.137-138).

මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර සහ යටිනුවර (දෙනුවර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකෙහි සිංහල, දමිළ හා මුස්ලිම් ජන මිශ්‍රණය ඉතා ඉහළ එකකි. එසේම සිංහල සමුහය අතර විවිධ කුල නියෝජනය සහ අවේණික ජීවනෝපායන්හී නිරතවීම දැකිය හැකිය. මෙහි එක් එක් ජනයගේ ජීවන වෘත්තීන් සමාජ සහජීවනයට කරනු ලබන බලපෑම මෙන්ම, අවේණික ජීවන වෘත්තීන් පවත්වා ගැනීමට සමාජ සාධකවලින් ඇතිකර තිබෙන බලපෑම සහ ඒවායෙහි වර්තමානයේ සිදුවී ඇති වෙනස්කම් පිළිබදවත් තොරතුරු මෙම අධ්‍යයන ලිපියෙන් ඉදිරිපත් කරනු ලැබේ.

2. අධ්‍යයන ක්ෂේත්‍ර

මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර හා යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙක අධ්‍යයන ක්ෂේත්‍ර වේ. සිංහල- මුස්ලිම් ජනමිශ්‍රණයේ ඉහළ සංයුතියක් පැවතීම සහ ජීවනෝපායන් හී සමානතා පෙන්නුම් කිරීම යන කරුණු මෙම ප්‍රදේශ අධ්‍යයන සඳහා තෝරා ගැනීමට හේතුවිය. උඩුනුවර හා යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල ජනතාවගේ ජීවනෝපායන් ප්‍රධාන වශයෙන් කෘෂිකර්මාන්තය, වෙළෙඳාම, ස්වයං රැකියා, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියා සහ සේවා ක්ෂේත්‍රය සමඟ සම්බන්ධ වේ. 2012 ජන හා නිවාස සංගණනය අනුව උඩුනුවර ජනගහනය 110,905ක් වූ අතර එයින් සිංහලයන් 80,679ක් සහ ශ්‍රී ලංකා මුවර්/මුස්ලිම් ජනතාව 27,033ක් විය. යටිනුවර ජනගහනය 106,027ක් වූ අතර සිංහලයන් 95,285ක් සහ මුස්ලිම් ජනතාව 7,564ක් විය. මෙම ප්‍රදේශ දෙකේ භූගෝලීය පරිසරය කෘෂිකර්මාන්තයට හිතකර බැවින් සිංහල හා මුස්ලිම් දෙපාර්ශ්වයම තේ, ගම්මිරිස්, කරාබුනැටි, කෝපි වැනි වාණිජ බෝග මෙන්ම එළවළු හා ගෙවතු වගාවන්හි නිරත වෙති. මහනුවර දිස්ත්‍රික් සංඛ්‍යාලේඛන අනුව ගම්මිරිස්, කරාබුනැටි සහ කෝපි උඩුනුවර හා යටිනුවර ඇතුළු ප්‍රදේශවල සැලකිය යුතු ලෙස වගා කෙරේ (Department of Census and Statistics, 2012,p.20).

3. අධ්‍යයන අරමුණු

3.1 ප්‍රධාන අරමුණ

ශ්‍රී ලංකාවේ වෘත්තීය විවිධත්වය සහ බහුසංස්කෘතිකත්වය සහ සමාජ වෙනස්වීම විමර්ශනය කිරීම.

3.2 උප අරමුණු

- ශ්‍රී ලංකාවේ පවතින වෘත්තීය විවිධත්වයේ ස්වභාවය සහ එහි ප්‍රධාන ලක්ෂණ හඳුනාගැනීම.
- විවිධ වෘත්තීය ක්ෂේත්‍ර තුළ බහුසංස්කෘතිකත්වය ක්‍රියාත්මක වන ආකාරය සහ එහි වැදගත්කම විශ්ලේෂණය කිරීම.
- වෘත්තීය විවිධත්වය හා බහුසංස්කෘතිකත්වය ශ්‍රී ලංකාවේ සමාජ සබඳතා, සමාජ ඒකාබද්ධතාව සහ සමාජ වෙනස්වීම කෙරෙහි ඇති බලපෑම අධ්‍යයනය කිරීම.

4. පර්යේෂණ ක්‍රමවේදය

අධ්‍යයන තොරතුරු රැස් කිරීමට ප්‍රාථමික සහ ද්විතීයික ක්‍රමවේද භාවිත කෙරිණි. ප්‍රාථමික ක්‍රමයේදී අරමුණු සහගත ක්‍රමවේදය ඇසුරින් 20 දෙනෙකුගේ නියැදියක් තෝරා ගැණුනි. දේශීය වෛද්‍ය ප්‍රතිකාර සිදුකරනු ලබන මුස්ලිම් වෛද්‍යවරුන් 3ක් හා එම සේවා ස්ථානවල සහායකයින් 2ක් ද, අදාල වෛද්‍ය පවුලේ මුස්ලිම් විවාහක ස්ත්‍රී 5ක් සහ මෙම වෛද්‍ය මධ්‍යස්ථාන වලින් ප්‍රතිකාර ගනු ලබන සිංහල විවාහක පිරිමි 5ක් හා ස්ත්‍රී 5ක් යොදා ගැණුනි. අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මගින් අධ්‍යයන තොරතුරු රැස් කෙරිණි. ඊට අමතරව අධ්‍යයන ක්ෂේත්‍ර නිරීක්ෂණය සහ මූලික තොරතුරු සපයන්නන් මගින් දත්ත රැස්කර ගන්නා ලදී.

ද්විතීයික තොරතුරු සඳහා උඩුනුවර සහ යටිනුවර ප්‍රාදේශිය ලේකම් වාර්තා, ග්‍රම නිළධාරී වාර්තා, ජන සංගණ දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තා සහ අධ්‍යයන ප්‍රදේශය ආශ්‍රිතව ලියා පළ කොට ඇති වෙනත් ග්‍රන්ථ හා ලිපි ලේඛණ භාවිත කෙරිණි. අධ්‍යයන තොරතුරු විශ්ලේෂණය තේමාකරණය යටතේ සිදුකරන ලදී.

5. අධ්‍යයන විශ්ලේෂණය

5.1 බහුවාර්ගික සමාජ පසුබිම

උඩුනුවර සහ යටිනුවර (දෙනුවර) යන දෙපළාතේ බහුජන නියෝජනය අතීතයේ සිට පැවත එන්නකි. සිංහල ජනතාව මෙම ප්‍රදේශවල මුලින්ම වාසස්ථාන ගතවීම ගැන සඳහන් වේ. උඩුනුවර ගම්පොළ හා මහනුවර යුගයේ පමණක් නොව අනුරාධපුර පොළොන්නරු, දඹදෙණි, යාපහු, සීතාවක, කෝට්ටේ යුගවලද දෙනුවර රට සිංහලේ රාජ්‍යයට සම්බන්ධ ඓතිහාසික වැදගත් භූමි භාගයක් විය. ඇතැම් විට රජකමට සුදුස්සා ඉදිරිපත් කලේ ද දෙනුවර රටෙනි. මහනුවර යුගයේ සිංහල රජුන් සියලු දෙනාම දෙනුවර රජ පෙළපතින් බිහි වුවෝය. මුල් පදිංචිකරුවන් අතර උරුවේල ශාක්‍යයන් තෝරාගත් ගොවි බිම උඩුනුවර උරුවේල නමින් හැඳින්වෙන උරුලෑවත්ත ප්‍රදේශයයි. ගඩලාදෙණි, ලංකාතිලක, ඇම්බැක්ක වැනි විහාරදේවාල හා ඒ වටා විහිදුන සංස්කෘතික උරුමය අදත් රටට දායාදයකි. ජන ජීවිතය අතින් බැලුවද ඉපැරණි යුගයේ සිට මේ දක්වා අගය කළ යුතු කරුණු රාශියක් ඇත. රජතුමාගේ රාජකීය වෛද්‍යවරයා, දක්ෂ ගොවියා තෝරාගත්තේ උඩුනුවරිනි. සෙංකඩගල රාජධානි යුගයේ උඩුනුවර නමින් මහනුවර නගරයේ වීදියක් තිබුණි. ඓතිහාසික මහනුවර පෙරහැර නැරඹීමට උඩුනුවර දස්කර

ගොවීන්ට වේදිකාවක් රජු විසින් වෙන්කර දීම ගැන කරුණු සඳහක් වෙයි (හේරත් සහ බණ්ඩාර, 2009,pp.321-378).

දෙනුවර පළාතෙහි සිංහල ජනයා පිළිබඳ විමසීමේදී බණ්ඩාරවරුන් වැදගත් සාධකයක් වේ. ගම්පොළ යුගයේදී දෙනුවර බණ්ඩාරවරුන් විශාල පිරිසක් සිටි බව පෙනේ. එයට පෙරත් දෙනුවර හා බලවිට බණ්ඩාරවරුන් සිටි බව හඳුනා ගෙන ඇත. දෙනුවර සිටි බණ්ඩාරවරුන් මෙසේයි. උරුලෑවතු ගම්පහ විජයසුන්දර බිසෝබණ්ඩාර, ගනේගොඩ යාපා බණ්ඩාර, රන්මුග්ගොඩ කුමාර බණ්ඩාර, දන්තුරේ තුනයා බණ්ඩාර, පිළිගම කඳුරේ බණ්ඩාර, සිද්දාඋල්ලේ සෙනරත් බණ්ඩාර, උනම්බුවේ යාපා බණ්ඩාර, අලපලාවෙල අබේසිං බණ්ඩාර, අළුදෙණියේ මාහිමි බණ්ඩාර, පිළිගල්ලේ කුමාර බණ්ඩාර, යාළේගොඩ මහා බණ්ඩාර, සිඳගල සීලවතී බණ්ඩාර, පායින්ගමුවේ ඉරුගල් බණ්ඩාර, වෙලම්බොඩ විජයරාජ බණ්ඩාර, ඕකේවක සුරියදාස් බණ්ඩාර, කිරිබත්කුඹුරේ පනික්කි බණ්ඩාර, ඇරැව්වාවල කුමාර පනික්කි බණ්ඩාර, මාත්ගමුවේ හෙනකඳ බිසෝබණ්ඩාර වශයෙනි (තුන්දෙණිය සහ ගුණවංශ හිමි, 1987).

මෙම බණ්ඩාරවරුන්ට ඉන්දියානු සම්බන්ධතාව පැවති බව හඳුනාගත හැකිය. ඉන්දියාවේ සිට පැමිණි (දෙමළ) පිරිසක් ලක්දිව සිටි රජවරුන් හා ඥාති සම්බන්ධය ඇතිකර ගැනීමෙන් පසුව මෙවැනි බණ්ඩාර පරපුරක් බිහිවිණැ යි කීමේ වරදක් නොපෙනේ. හින්දු කෝවිල්වල පූජා පැවැත්වීම සඳහා පැමිණි පණ්ඩාරවරුන්ගෙන් ලක්දිව බණ්ඩාර පරපුරක් බිහිවිණැයි කෙනෙක් පවසති. කෙසේ නමුත් මෙහිදී වැදගත් වන්නේ සිංහල හා දෙමළ ජන කොටස් සම්මිශ්‍රණය දෙනුවර පළාතෙහි පැවති බවයි. විශේෂයෙන්ම ඉන්දියානු ආක්‍රමණ වලට යටත් වීම සහ දෙමළ රජවරුන් යටතේ රට පාලනය වීම මෙරට දෙමළ ජනයාගේ ව්‍යාප්තියට හේතුවිය. දෙමළ රජවරු සිංහල කුල කාන්තාවන් විවාහ කර ගැනීම මගින් එම තත්ත්වය තවත් වැඩිවිය. කීර්ති ශ්‍රී රාජසිංහ නායක්කාර්වංශික බිසවුන් සතර දෙනෙකු සමඟ විවාහ ගිවිස ගත් අතර ඒ සතර දෙනාටම දරුවන් නැත. එයින් පසු කීර්ති ශ්‍රී රාජසිංහ මාම්පිටිය දිසාවගේ දියණියක සමඟ විවාහ වී පුතුන් දෙදෙනෙකු හා දියණියන් සතර දෙනෙකු ලද බව කියනු ලැබේ. මාම්පිටිය දිසාවගේ පරපුරේ අය නැවත සිංහල රාජවංශයක් ඇති කිරීමට ඉදිරිපත් වූ බවට සාක්ෂි නැත.සමහර විට ඒ නායක්කාර්වංශික බලය ඒ සියල්ල යටපත් කරගන්නට තරම් ශක්තිමත්ව සිටියා වන්නට ඇත (බණ්ඩාර, 2009,pp.175-218).

දෙනුවර පළාතේ මුස්ලිම් ජන නියෝජනයේ විශේෂතා දක්නට ලැබේ. ඉතිහාසගත තොරතුරු අනුව සිංහල මුස්ලිම් විවාහයන් හදුනා ගත හැකිය. පෘතුගීසි බලපෑම නිසා සෙංකඩගල රජු වු සෙනරත් මහියංගණය ප්‍රදේශයට පැන යයි. එහි වාසය කරමින් සිටියදී දෙවන රාජසිංහගේ උපත සිදුවෙයි. ඔහු වැඩිවියට පත් කල්හී භාෂා ශාස්ත්‍ර අතින් පමණක් නොව යුධ ශිල්පයෙහි ද දක්ෂයෙක් විය. විවිධ ජාතීන්ගේ සුරූපීන් එතුමාගේ අන්තඃපුරයේ විසු බව කියනු ලැබේ. මහියංගණයේ වාසය කරන කාලයේ මුස්ලිම් කාන්තාවක් විවාහ කර ගැනීමෙන් මුස්ලිම් ජනතාවගේ සහයෝගය ද එතුමාට ලැබුනු බව කියනු ලැබේ. මහියංගණ පඟරගම්මන නැඟෙනහිර පළාතේ නිත්තවුර් වැනි ප්‍රදේශ මුස්ලිම් ජනතාව සතු කලේ සෙනරත් රජතුමායි. ඒ සියල්ලෙන් ඔහු බලාපොරොත්තු වුයේ පෘතුගීසි පළවා හැරීමට තුන්වන පාර්ශවයකගේ සහය ලබා ගැනීම වන අතර එය සාර්ථක විය (බණ්ඩාර, 2009,pp.175-218).

දෙනුවර පළාතේ මුස්ලිම් ජනයාගේ වාසස්ථාන ගතවීම අතීත රාජ්‍ය පාලන සමය තෙක් දිවයයි. රොබට් නොක්ස්ගේ ලංකා විස්තරයේ දැක්වෙන පරිදි පුණ්‍යවන්ත බෞද්ධයින් විසින් සිදුකළ ඉඩම් පරිත්‍යාගයන් මුස්ලිම්වරුන්ගේ වාසස්ථාන ගතවීමට හේතුවී තිබේ. එසේම රජු විසින් ලබාදුන් ඉඩම් මුස්ලිම් ජනයාගේ පදිංචියට හේතුවිය. පෘතුගීසීන්ගේ හා ලන්දේසීන්ගේ තාඩන පීඩන විඳදරාගත නොහැකි වු මුස්ලිම් ජනයා සරණපතා උඩරට රාජධානියට පැමිණි අතර රජතුමා විසින් මෙම අය සාදරයෙන් පිළිගෙන කොන්දේසි දෙකකට යටත්ව උඩරට ප්‍රදේශයේ පදිංචිවීමට අවසර ලබා දී තිබේ. පළමු කොන්දේසිය නම් මොවුන් සිය මව් රටවලින් කාන්තාවන් සමඟ නොපැමිණි නිසා තම තමන්ගේ තරාතිරම්වලට අනුව සුදුසු සිංහල කාන්තාවන් සමඟ ආවාහ විවාහ සිදුකර ගැනීම. දෙවැන්න වුයේ තමා විවාහවන කාන්තාවන්ගේ සිංහල වාසගම් තම නමට එකතු කරගත යුතු බව. අදත් ගෑහ මුලික හා ඡන්ද ලැයිස්තුවලින් පෙන්නුම් කෙරෙන පරිදි මුස්ලිම් ජනයාගෙන් සැහෙන කොටසකට සිංහල වාසගම් ඇත (බණ්ඩාර, 2009,pp.175-218).

දෙනුවර ප්‍රදේශයේ ජීවත්වන සියලුම ජනවර්ග වලට අයිති මිනිසුන්ගේ ආරම්භය අතීතයට දිවෙන බවත්, මෙහිදී සිංහල හා මුස්ලිම් මිනිසුන් අතර සාමකාමී බව පැවති අන්දමත් පහත ප්‍රකාශයෙන් පැහැදිලි වෙයි.

"මේ පළාතේ ජීවත්වෙන මුස්ලිම් අය රජකාලේ ඉඳන් ඉන්න අය. මුලින්ම වෙළදාමට ඇවිත් තියෙන්නේ. රජතුමාගේ අණක් ලෙස සිංහල ගැහැණු අය කසාද බැඳල තියෙන්නේ. ඒ පරම්පරාව තමා මේ එන්නේ. ඒ කාලේ අපේ අප්පච්චිලාට තමා ඒ

අයගේ මඟුල් ගෙවල් වලට මුලින්ම කථා කරල තියෙන්නේ. අයියා, මල්ලි, නංගී කියලා කතා කරමින් ඉස්සර හොඳට හිටියා. අපි දෙගොල්ලෝ කිසි ප්‍රශ්නයක් නැතිව හොඳින් හිටියා. දේශපාලනය තමා ඡන්ද බලාගෙන දෙගොල්ලෝ අතර බේදය ඇති කළේ." (සම්මුඛ සාකච්ඡාව 1, පිරිමි- සිංහල).

දෙනුවර ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව පිටස්තර පිරිසක් ලෙස නොව දීර්ඝ කාලයක සිට ප්‍රදේශයේ ජීවත් වන ප්‍රජාවක් ලෙස හඳුනාගන්නා ආකාරය ඉහත ප්‍රකාශයෙන් හෙළිවෙයි. "රජකාලේ ඉඳන් ඉන්න අය" යන ප්‍රකාශය මගින් ඔවුන්ගේ ප්‍රාදේශීය පැවැත්මට ඓතිහාසික අඛණ්ඩතාවක් ලබා දෙයි. එමඟින් මුස්ලිම් ප්‍රජාවගේ පැවැත්ම නූතන සංක්‍රමණයක ප්‍රතිඵලයක් නොව පරම්පරා ගණනාවක් පුරා පැවත එන සමාජ සම්බන්ධතාවක් බව පැහැදිලි වෙයි.

එමෙන්ම මෙම ජනයාගේ ආගමනය වෙළෙඳ කටයුතු සමඟ සම්බන්ධ වන අන්දම "මුලින්ම වෙළඳාමට ඇවිත් තියෙන්නේ" යන ප්‍රකාශයෙන් තහවුරු වෙයි. එසේම "රජතුමාගේ අණක් ලෙස සිංහල ගැහැණු අය කසාද බැඳල තියෙන්නේ" යන ප්‍රකාශය මගින් මූලාශ්‍ර කරුණු සනාථ කරයි. එමෙන්ම "ඒ පරම්පරාව තමා මේ එන්නේ" යන ප්‍රකාශය මගින් වර්තමාන මුස්ලිම් ප්‍රජාව අතීතයේ පැවති සමාජ සම්බන්ධතාවල පරම්පරාගත අඛණ්ඩ පැවැත්මක් ලෙස විකාශනය වන අන්දම හඳුනාගත හැකිය.

කිසියම් ප්‍රජාවක සිය අනන්‍යතාවය ගොඩනැගීමේදී "හවුල් ඉතිහාස මතකය" (shared history) වැදගත් වන අන්දම මෙයින් පැහැදිලි වෙයි. අනෙක් අතට සෙසු ජනතාව සමඟ වාසය කිරීමේදී මෙම ඉතිහාසය පිළිබඳ අදහස් අන්‍යෝන්‍ය සහජීවනය කෙරෙහි ඉහළ බලපෑමක් ඇති කරයි. ඔවුනොවුන් අතර කතාබහේදී "අයියා මල්ලි නංගී කියලා" කතා කිරීම ගැන අදහස් පවසා ඇත. මෙහිදී සැබෑ ඥාති සම්බන්ධයක් නොතිබුණ ද ආමන්ත්‍රණයේදී ඥාති පද භාවිතය නිසා ඔවුනොවුන් අතර ජනවාර්ගික වෙනස්කම පිළිබඳ අදහස් බැහැර කොට අන්‍යෝන්‍ය සමීප බව ගොඩනැගීමට තිබෙන ඉඩකඩ වැඩිය.

එමෙන්ම "ඒ කාලේ අපේ අප්පච්චිලාට තමා ඒ අයගේ මඟුල් ගෙවල් වලට මුලින්ම කථා කරල තියෙන්නේ" යන ප්‍රකාශය මඟින් සිංහල මුස්ලීම් ජන සමූහ දෙක

අතර ශක්තිමත් බැඳීමක් පැවති බව දැකගත හැකියි. මෙහි "මුලින්ම කතා කිරීම" යන සඳහන විශේෂයෙන්ම සමාජ සමීපත්වය සහ අන්‍යෝන්‍ය පිළිගැනීම පිළිබඳ ප්‍රබල සංකේතයක් පෙන්නුම් කරවයි. විවාහ මංගල්‍යය වැනි පවුල්මය හා ප්‍රජාමය අවස්ථාවලදී එකිනෙකා සහභාගී කර ගැනීම මගින් සමාජ ඒකාබද්ධතාව සහ අන්තර්ප්‍රජා විශ්වාසය ප්‍රදේශයේ අතීත සමාජය තුළ හොඳින් පැවති අන්දම මෙයින් ගම්‍ය වේ.

කෙසේ නමුත් සිංහල මුස්ලීම් ජන සමූහ දෙක අතර මතබේද හා ගැටුම් ඇතිවීමට දේශපාලනමය කරුණු බලපාන අන්දම ඉහත සාකච්ඡාවෙන් පවසා ඇත. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනවාර්ගික ගැටුම සිංහල-දෙමළ ගැටුම වුවද, මුස්ලිම් ප්‍රජාවද විවිධ ආකාරයේ දේශපාලන හා ප්‍රජා ප්‍රචණ්ඩත්වයට මුහුණ දී තිබෙන බවයි. මුස්ලිම් ජනතාවගේ ගැටලු ශ්‍රී ලංකාවේ ජාතික ගැටුම සහ සාම ක්‍රියාවලිය අවබෝධ කර ගැනීමේදී වැදගත් නමුත් බොහෝවිට එය නොසලකා හැරුණු බව සඳහන් කරයි (International Crisis Group, 2007,pp.9-11). 2014 ජුනි මාසයේ අලුත්ගම සහ බේරුවල ප්‍රදේශවල ඇති වූ ප්‍රචණ්ඩත්වය නිසා මුස්ලිම් නිවාස, ව්‍යාපාරික ස්ථාන සහ පල්ලිවලට ප්‍රහාර එල්ල වූ අතර පුද්ගලයන් මියගොස් විශාල පිරිසක් තුවාල ලැබූහ. 2018දී අම්පාර සහ මහනුවර ප්‍රදේශවල නැවතත් මුස්ලිම් විරෝධී ප්‍රචණ්ඩත්වය පැතිරිණි. මහනුවර සිංහල-මුස්ලිම් ප්‍රචණ්ඩත්වය හුදෙකලා සිදුවීමක් නොව මීට පෙර අම්පාර හා ගිංතොට සිදුවීම් ඇතුළු ප්‍රචණ්ඩ ක්‍රියා මාලාවක කොටසක් බව පෙන්වා දෙයි (Human Rights Commission of Sri Lanka, 2018,p.12).

ඉහත සම්මුඛ සාකච්ඡාවෙන් හෙළිවන පරිදි පෙර පැවති සමාජ සහජීවනය බිඳ වැටීම සිදු වී තිබෙනුයේ සිංහල හා මුස්ලිම් ජනතාව අතර හටගත් විරසකයක් නිසා නොවන බව පැහැදිලි වෙයි. ජනවාගික වෙනස්කම් දේශපාලන අරමුණු සහ ඡන්ද ලබාගැනීමේ උපායමාර්ග ලෙස භාවිතයට ගැනීම හේතුවෙන් එම තත්ත්වයන් ඉස්මතු වී තිබේ. මෙය වෙනත් ලෙසකට පවසනවා නම් ජනවර්ග දෙක අතර පතිනන සංස්කෘතික වෙනස්කම් දේශපාලනීකරණය කිරීම නිසා ජනවර්ග අතර විරසකය නිර්මාණය කර තිබෙන බවයි. මෙයින් අනාවරණය වන්නේ ගැටුමට හේතුව සංස්කෘතික හෝ ආගමික වෙනසට වඩා දේශපාලන මැදිහත්වීම බලපා තිබෙන බවයි.

දෙනුවර අධ්‍යයන ක්ෂේත්‍රයේ මුස්ලීම් ජනගහනය ක්‍රමයෙන් වර්ධනය වීම කැපී පෙනෙන දෙයක් විය. විශේෂයෙන් උඩුනුවර ප්‍රදේශයේ ඉතා ඉහළ මුස්ලිම් ජන ඝණත්වයේ දැකිය හැකි විය. එම ජනගහන වැඩිවීමට සාපේක්ෂ සිංහල ජනගහන වර්ධනයක් සිදුවී නැත. අනෙක් අතට අලුතින් පාසල් හා ආගමික සිද්ධස්ථාන විවෘත වීම, එසේම වෙළඳ ව්‍යාපාර හිමිකාරිත්වය හා ඒ මඟින් ඉහළ ආර්ථික ස්ථාවර බව ගොඩනගා ගැනීම මෙම ප්‍රජාවට විශේෂිත කරුණු විය. මෙයට අමතරව වර්තමානයේ දෙපාර්ශවයේම තරුණ පරම්පරාව සම්ප්‍රදායික සමාජ ඇගයුම් වලින් ඈත්වීම දෙපාර්ශවීය සම්බන්ධතා ක්‍රමයෙන් දුර්වල කිරීම බලපා තිබේ. මේ බව තවදුරටත් පහත සම්මුඛ සාකච්ඡාවෙන් අනාවරණය වෙයි.

"*මුස්ලිම් අය මෙහෙට (දෙනුවරට) ආපු කාලය මහනුවර යුගයට අයත් වෙයි. වෙදකම සඳහා ආ ගමනක්. ලීමගහ කොටුව, කජුගහ කොටුව කියන්නේ මුස්ලිම් වෙඳුන් ඉන්න තැන්. තවත් අය වෙළදාම් කරපු අය. ඉස්සර අපි දෙගොල්ල අතර බොහොම කිට්ටු සම්බන්ධයක් තිබුණා. නෝම්බි කාලෙට- සිංහල අවුරුද්දට කැවිලි පෙවිලි බෙදා හදා ගන්නවා බේද මොකුත් නෑ. ඒත් අද ඒවා නෑ. කාලානුරූපීව ඒවා නැතිවෙලා ගියා. හේතුව කාර්ය බහුල බව. දැන් සිටින තරුණ පරම්පරාව කල්පනා කරන විධිය.*" (සම්මුඛ සාකච්ඡාව 2, පිරිමි-මුස්ලිම්).

මහනුවර යුගයේ සිට දෙනුවර ප්‍රදේශය මුස්ලිම් ජනයාගේ පදිංචිය ගැන කරුණු අනාවරණය වෙයි. මහනුවර යුගය ශ්‍රී ලංකා ඉතිහාසයේ අවසාන ස්වදේශීය රාජධානි සමය ලෙස සැලකේ. 16 වන සියවසේදී පෘතුගීසීන් මුහුදුබඩ ප්‍රදේශ අත්පත් කරගැනීමත් සමඟ රටේ දේශපාලන තත්ත්වය විශාල ලෙස වෙනස් විය. එම අවස්ථාවේ මධ්‍යම කඳුකරය ආශ්‍රිතව ස්වාධීන රාජ්‍යයක් ලෙස මහනුවර රාජධානිය වර්ධනය විය. මහනුවර ශ්‍රී ලංකාවේ අවසාන සිංහල රාජධානියේ අගනුවර වූ අතර විදේශීය බලවේගවලට එරෙහිව දිගුකාලීනව ස්වාධීනත්වය රැකගත් රාජ්‍යයක් විය.

මුස්ලිම්වරු දෙනුවර පළාතේ පදිංචියට මූලික හේතුවක් වී ඇත්තේ වෙදකම හා සම්බන්ධ වෘත්තීය අවශ්‍යතා සඳහා බව පැහැදිලි විය. මෙය එක්තරා ලෙසකින් මුස්ලිම්වරුගේ පැමිණීම හුදෙක් පදිංචිය සඳහාම පමණක් නොව එවකට පැවති

සමාජයේ අවශ්‍යතා සමඟ සම්බන්ධ වූ ක්‍රියාවලියක් ලෙසද හඳුනා ගත හැකිය. "ලීමගහ කොටුව, කජුගහ කොටුව" වැනි ස්ථාන මුස්ලිම් වෙදුන්ගේ වාසස්ථාන ලෙස සඳහන් වීමෙන් එම ප්‍රජාවගේ භූගෝලීය පදිංචි රටාව හා වෘත්තීය අනන්‍යතාව පිළිබඳ අදහස් ඉදිරිපත් වේ. එමෙන්ම සියලුම මුස්ලිම් ජනතාව වෙදකමට පමණක් සීමා නොවූන අතර සමහර අය වෙළෙඳාමේ නිරත වූහ. එබැවින් ප්‍රධාන වශයෙන් දෙනුවර ප්‍රදේශයේ මුස්ලිම් ප්‍රජාවගේ ආර්ථික දායකත්වය වෙදකම මෙන්ම වෙළෙඳාම යන ක්ෂේත්‍ර දෙකටම අදාල වී තිබේ.

අතීතයේ සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර සමීප බව පැවති අන්දම "අපි දෙගොල්ල අතර බොහොම කිට්ටු සම්බන්ධයක් තිබුණා" යන ප්‍රකාශයෙන් අවධාරණය වේ. මුස්ලිම් සමුහයෙ නෝම්බි සමය සහ සිංහල සමුහයේ සිංහල අලුත් අවුරුද්ද වැනි ආගමික හා සංස්කෘතික අවස්ථාවල කැවිලි-පෙවිලි හුවමාරු කරගැනීම, ප්‍රජා දෙක අතර පැවති සංස්කෘතික සහභාගීත්වය, අන්‍යෝන්‍ය ගෞරවය සහ සමාජීය විශ්වාසය පිළිබිඹු කරයි. එම අවස්ථාවල එක් එක් පාර්ශවයට සංස්කෘතික හා ආගමික අනන්‍යතාව පැවතියද දෛනික සමාජ ජීවිතයේදී එය දැඩි සීමා ගෙනදීමට බලනොපෑ අන්දම "බේද මොකුත් නෑ" යන ප්‍රකාශයෙන් පැහැදිලි වේ.

මෙම සාම්ප්‍රදායික සිංහල මුස්ලිම් අන්තර් සහජීවනය ක්‍රමයෙන් දුර්වල වීමට " කාර්ය බහුල බව" ප්‍රධාන හේතුවක් වී ඇත. ආර්ථික සාධකය ප්‍රධාන කරගත් නූතන ජීවන රටාවේ අව්වේකි බව මැනවින් දක්නට ලැබේ. නූතන සමාජයේ මිනිසාගේ ජීවන රටාව කෙරෙහි ආර්ථික සාධකය ප්‍රබල ලෙස බලපායි. වැඩි ආදායමක් උපයා ගැනීම, උසස් ජීවන තත්ත්වයක් පවත්වා ගැනීම සහ පාරිභෝගික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මිනිසුන් වැඩි කාලයක් රැකියාවට හා ආර්ථික කටයුතුවලට යොමු වෙති. එහි ප්‍රතිඵලයක් ලෙස විවේකය, පවුල් සබඳතා සහ මානසික සුවතාව සඳහා වෙන් කළ කාලය අඩුවීම දැකිය හැකිය. දිගුකාලීන ආතතිය පුද්ගලයාගේ මානසික හා ශාරීරික සෞඛ්‍යයට අහිතකර බලපෑම් ඇති කළ හැකිය. ආර්ථික තරගකාරීත්වය වැඩිවීමත් සමඟ "වැඩි වැඩ කිරීම වැඩි සාර්ථකත්වය" යන අදහස සමාජයේ ස්ථාපිත වීම නිසා විවේක කාලය පවා ආර්ථික වටිනාකමකින් මැනීමට පෙළඹීමක් ඇති වී තිබේ. විශේෂයෙන් නාගරික පරිසරය තුළ දීර්ඝ සේවා වේලාවන්, ගමනාගමන කාලය, අමතර ආදායම් සෙවීම සහ ඩිජිටල් තාක්ෂණය හේතුවෙන් පුද්ගලයාට සැබෑ විවේකයක් ලබා ගැනීම අපහසු වී ඇත (World Health Organization, 2021).

වර්තමාන සමාජයේ පරම්පරා අතර ඇතිවී තිබෙන පරතරය ජනවර්ග අතර පමණක් නොව සමාන ජනවර්ගය තුළද අන්‍යෝන්‍ය සහජීවනය දුර්වල කිරීමට බලපා තිබේ. වැඩිහිටි පරම්පරාව විසින් වැදගත් කොට සැලකූ අසල්වැසි සබඳතා, ආහාර හුවමාරුව, උත්සවවල අන්‍යෝන්‍ය සහභාගීත්වය වැනි ක්‍රියාකාරකම් නව පරම්පරාව තුළ එතරම් ප්‍රමුඛ නොවීම ගැන අදහස් දක්වා ඇත. ඒ බව "දැන් සිටින තරුණ පරම්පරාව කල්පනා කරන විධිය" යන ප්‍රකාශය සැලකිය හැකිය. වර්තමාන තරුණ පරම්පරාව අතීත පරම්පරාවට වඩා වෙනස් ආකාරයකින් සිතමින් කටයුතු කරන පිරිසකි. තාක්ෂණයේ දියුණුවත් සමඟ ඔවුන්ගේ දැනුම හා අදහස් වේගයෙන් වර්ධනය වී ඇත. අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය භාවිතයෙන් ලෝකයේ සිදුවන දේ පිළිබඳව ඉක්මනින් තොරතුරු ලබාගැනීමට ඔවුන්ට හැකියාව ඇත. තමන්ගේ අනාගතය පිළිබඳව ස්වාධීනව තීරණ ගැනීමටත්, නව අදහස් අත්හදා බැලීමටත් ඔවුන් කැමතිය. එසේම සාම්ප්‍රදායික සීමාවන්ට වඩා නිදහස, සමානාත්මතාව සහ පෞද්ගලිකත්වය අගය කරති. මේ නිසා මොවුන් සම්ප්‍රදායික සමාජයේ පිළිගැනීම් වලින් බැහැර වන තත්ත්වයක් දක්නට ලැබේ.

5.2 සිංහල- මුස්ලිම් අන්තර් සම්බන්ධය කෙරෙහි අධ්‍යාපනයේ බලපෑම

ශ්‍රී ලංකාවේ අනෙකුත් පළාත්වලට සේම දෙනුවර කලාපයේ පාසල් වෙන් කිරීම ජනවාර්ගික කාරණය පදනම් කොට සිදුකර තිබේ. දෙනුවර අධ්‍යාපන කලාපය මහනුවර දිස්ත්‍රික්කයට අයත් වන අතර එය උඩුනුවර සහ යටිනුවර යන අධ්‍යාපන කොට්ඨාස දෙකකින් සමන්විත වේ. 2020 පාසල් සංගණන දත්ත අනුව දෙනුවර අධ්‍යාපන කලාපයේ පාසල් 87ක් පැවති අතර ඉන් උඩුනුවර කොට්ඨාසයේ පාසල් 47ක් සහ යටිනුවර කොට්ඨාසයේ පාසල් 40ක් විය. එම පාසල් අතරින් දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව 2කි (Ministry of Education, 2020,p.108). ඉස්ලාමීය ආගමික ආයතන හෝ පල්ලි මඟින් ස්වාධීනව පවත්වාගෙන යනු ලබන අරාබි විද්‍යාල (මද්‍රසා පාසල්) පැවතිය හැකි වුවත්, ඒවා විධිමත් පාසල් පද්ධතියට හෝ කලාප අධ්‍යාපන කාර්යාලීය පාසල් වර්ගීකරණයට අයත් නොවේ. කෙසේ නමුත් උඩුනුවර සහ යටිනුවර අරාබි විද්‍යාල/මද්‍රසා අවම වශයෙන් 4ක් තිබේ.

උඩුනුවර අවම වශයෙන් 2ක් (Al-Haqqaniyyah Arabic College – Daskara; Al-Madrasathul Minhajiyya Arabic College - Batupitiya) යටිනුවර අවම වශයෙන් 2ක් (Mazahirul Uloom Arabic College – Muruthalawa; Rawahiyyah Arabic

College – Dehianga.) වශයෙන් හඳුනාගත හැකිය. එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ දෙනුවර තිබෙන මුලු පිරිවෙන් ගණන 15කි. එයින් උඩුනුවර 6ක් සහ යටිනුවර 9ක් ක්‍රියාත්මක වෙයි (ක්ෂේත්‍ර අධ්‍යයන තොරතුරු ඇසුරිනි 2023).

පාසල් අධ්‍යාපනය ජනවර්ගය සහ ආගම අනුව බෙදා වෙන් කිරීම නිසා අධ්‍යාපන ක්‍රියාවලියෙන් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අභියෝග ඉස්මතු වී තිබේ. යටත් විජිතවාදයෙන් පසුව උරුම කර දී තිබෙන අධ්‍යාපන ක්‍රමය පමණක් නොව නීති රීති, පක්ෂ දේශපාලනය මෙන්ම බොහෝ සමාජ හර පද්ධතීන් මෙරට සමාජය එකමුතු කිරීමකට වඩා එය ඈත් කිරීමට බලපා තිබෙන බව විවිධ සමාජ අර්බුද වලින් විද්‍යාමාන කෙරේ. මෙරට පාසල් සිංහල, දෙමළ, මුස්ලිම්, කතෝලික ලෙස පමණක් නොව ගැහැණු, පිරිමි ලෙසද බෙදා තිබේ. එපමණක් නොව ග්‍රාමීය, නාගරික හා ජනප්‍රිය පාසල් යන වර්ගීකරණයන් ද කර ඇත (වීරකෝන්, 2020).

ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල මෙන්ම දෙනුවර කලාපයෙහි ස්ථාපිත පාසල් දෙස බැලීමෙන් ද පැහැදිලි වන්නේ ජනවාර්ගික සමඟිය ඇතිවන අන්දමට වඩා ජනවර්ග බෙදා වෙන් කරන පාසල් පද්ධතියක ක්‍රියාකාරිත්වයයි. නමුත් අධ්‍යයන ප්‍රදේශයේ මුස්ලීම් හා දෙමළ ජනවර්ගයට අයිති සිසුන් කිසියම් ප්‍රමාණයක් සිංහල මාධ්‍ය පාසල් වල අධ්‍යාපනය ලැබීම දක්නට ලැබුණි. එයින් සමහර සිසුන් සිංහල මාධ්‍ය තරඟ වලට ඉදිරිපත් වීම හා එයින් ජයග්‍රහණ ලබා ගෙන තිබේ. මුස්ලිම් හා දෙමළ සිසුන්ට සිංහල භාෂාව පිළිබඳ ඇති දැනුම එයින් ගම්‍ය වෙයි. බහුසංස්කෘතික සමාජයක පැවැත්මට බහුභාෂා භාවිතයෙන් ලැබෙන ප්‍රතිඵලය ඉහළය. කෙසේ නමුත් සිංහල සිසුන් දෙමළ මාධ්‍ය පාසල් වල ඉගෙනුම නොලබන බව අනාවරණය වුවකි. මෙම කාරණය බහුභාෂා හැසිරවීමේදී සමබරතාව දුර්වල කිරීමට බලපා ඇත. මේ තත්ත්වය ජනසමූහ අතර අන්‍යෝන්‍ය සම්බන්ධය දුර්වලතා කිරීමට හේතුවිය හැකිය.

මුස්ලිම් සහ දෙමළ සිසුන් වැඩියෙන් සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය නැඹුරුවීමේ ප්‍රවණතාවක් අධ්‍යයන තොරතුරු වලින් හෙළිවිය. ප්‍රදේශයේ ප්‍රාදේශීය පුස්තකාලය පරිහරණය කරන සිසුන් අතර වැඩි ප්‍රමාණයක් මුස්ලීම් ජන වර්ගයට අයිති බව පෙන්වා දුන්නේය.

"මේ පුස්තකාලේ සාමාජිකත්වය ලබා ගත් පිරිස සියයක් පමණ වෙනවා. වැඩියෙන් ඉන්නේ පාසල් සිසුන්. සිංහල මුස්ලිම් ජනවර්ග දෙකේම අය ඉන්නවා. පුස්තකාල සේවා මණ්ඩලය මගින් සිංහල භාෂා රචනා, චිත්‍ර, නිසදැස් කවි තරඟ පවත්වනවා. ඒවාට ජනවර්ග බේද නෑ. ඔක්කොම සහභාගී වෙනවා. දෙගොල්ලෝම තරඟ දිනලා තියෙනවා. මෙහේ මුස්ලිම් අයට හොඳට සිංහල පුළුවන්. වැඩියෙන් කියවන්නෙත් වැඩියෙන් එන්නෙත් මුස්ලිම් ළමයි." (සම්මුඛ සාකච්ඡාව 3, පිරිමි-සිංහල).

පුස්තකාලය "පොදු හමුවීමේ අවකාශයක්" (shared social space) ලෙස ක්‍රියා කිරීම දැකගත හැකිය. සාමාන්‍යයෙන් ජනවර්ග, ආගම හෝ භාෂාව අනුව වෙන්වීමට ඉඩ ඇති ප්‍රජාවක දරුවන් එකම ස්ථානයකදී කියවීම, තරඟ සහ නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වලට එක්වීම තුළින් දෛනික මට්ටමේ අන්තර්ජනවාර්ගික සම්බන්ධතා ගොඩනැගේ (Katherine, 2020,p.537)

ඉහත සම්මුඛ සාකච්ඡාවෙන් පැහැදිලි වන්නේ පුස්තකාල සේවා මණ්ඩල තරඟවල ජයග්‍රහණය එක් ජනවර්ගයකට සීමා නොවන බවයි. "දෙගොල්ලොම තරඟ දිනල තියෙනවා" යන ප්‍රකාශයෙන් සිංහල හා මුස්ලිම් දරුවන් අතර හැකියාව මත පදනම් වූ සමාන අවස්ථාවක් දැකිය හැකිය. මුස්ලිම් සිසුන් සිංහල භාෂා භාවිත දක්ෂතාවයෙන් ඉදිරියට පැමිණ තිබේ. මෙම තරගකාරී ක්‍රියාකාරකම් හුදෙක් විනෝදාස්වාදයක් නොව, ජනවර්ගික සීමා ඉක්මවා අන්තර්ජනවාර්ගික සම්බන්ධතා හා සමාජ සහභාගිත්වය වර්ධනය කරන ක්‍රියාකාරකම් ලෙස හඳුනාගත හැකිය.

භාෂාව අනන්‍යතාවයේ සීමාවක් ලෙස පමණක් සැලකීම සමාජයේ විවිධ ප්‍රජාවන් අතර දුරස්ථභාවයක් ඇති කළ හැකිය. විවිධ භාෂා කතා කරන පුද්ගලයන් එකිනෙකාගේ භාෂා ඉගෙනීම හා භාවිත කිරීම තුළින් සංස්කෘතික අවබෝධය, සහයෝගීතාව සහ අන්‍යෝන්‍ය ගෞරවය වර්ධනය කරගත හැකිය. විශේෂයෙන් බහුභාෂික සමාජයක භාෂා කිහිපයක් භාවිත කිරීම මගින් විවිධ ජනවාර්ගික කණ්ඩායම් අතර සන්නිවේදන බාධා අවම කර සමාජ ඒකාබද්ධතාව ශක්තිමත් කළ හැකිය (Fishman, 1999,pp.152-163). කෙසේ නමුත් සිංහල ජනවර්ගයට අයිති සිසුන්ට දෙමළ මාධ්‍ය භාෂා භාවිත හැකියාවේ ඇති දැඩි ඌණතාවට මුහුණ දීම නිසා සිංහල භාෂා සහ

දමිළ භාෂා භාවිත සිසුන් අතර භාෂා භාවිතයේ විෂමතාව හඳුනාගත හැකිය. මේ තත්ත්වය සමාජයක දිගු කාලීන සහජීවන පැවැත්මට බාධා ගෙන දිය හැකිය.

සාකච්ඡා අවස්ථාවක භාෂාවේ වැදගත්කම ගැන මෙසේ අනාවරණය කළ හැකිය.

"මෙහේ අපි සිංහල, මුස්ලිම් කියලා බේද නෑ. අපේ ඔක්කොමටම හොදට සිංහල පුලුවන්. මං පොත් ලියල තියෙන්නේ සිංහලෙන්... අපේ ඉතිහාසය අවුරුදු 1200ට වැඩියි. අපේ ආරම්භය මොරොක්කෝ රටෙන් තමයි පටන් අරන් තියෙන්නේ..."(සම්මුඛ සාකච්ඡාව- 4, පිරිමි-මුස්ලිම්)

ඉහත ප්‍රකාශය තුළින් සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර පවතින සමාජීය හා සංස්කෘතික සමීපතාව පිළිබඳ පැහැදිලි අවබෝධයක් හඳුනාගත හැකිය. පොදුවේ ජනවර්ග දෙකේ පවතින සමගිය "මෙහේ අපි සිංහල මුස්ලිම් කියලා බේද නෑ" යන ප්‍රකාශයෙන් ගම්‍ය කෙරේ. එසේම මෙමඟින් දෛනික සමාජ අත්දැකීම තුළ ආගමික හෝ ජනවාර්ගික බෙදීමකට වඩා සහජීවනය හා පොදු සමාජ අනන්‍යතාව අවධාරණය කරයි. විවිධ ප්‍රජාවන් අතර සංවාදය, අන්‍යෝන්‍ය අවබෝධය සහ සහජීවනය ප්‍රවර්ධනය කරන ක්‍රියාකාරකම් පිළිබඳ ඔහුගේ ධනාත්මක ආකල්පය ප්‍රකාශ වේ. එසේම මුස්ලිම් අනන්‍යතාවය සිංහල භාෂාව හා සාහිත්‍යය සමඟ සම්බන්ධ කරමින් ප්‍රකාශ කිරීම මඟින් සිංහල ප්‍රජාවට සමීපවීමේ කැමැත්ත සහ ඊට සුදුසුම ප්‍රවේශය හඳුනා ගැනීම දැකගත හැකිය. එබැවින් භාෂාව යන්න අනන්‍යතාවය ආරක්ෂා කරන මෙවලමක් මෙන්ම, ප්‍රජාවන් අතර අවබෝධය හා සහජීවනය ගොඩනඟන පාලමක් ලෙසද සැලකිය හැකිය.

භාෂාව යනු ජනවාර්ගික අනන්‍යතාවය ප්‍රකාශ කරන මාධ්‍යයක් පමණක් නොව, විවිධ ප්‍රජාවන් අතර සම්බන්ධතා ගොඩනඟන ප්‍රබල සන්නිවේදන හා සංස්කෘතික මාධ්‍යයකි. එක් එක් ප්‍රජාවක ඉතිහාසය, සම්ප්‍රදායන්, විශ්වාසයන්, සමාජ වටිනාකම් සහ සාමූහික මතකය භාෂාව තුළින් පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වේ. එම නිසා භාෂාව පුද්ගලයාගේ සහ ප්‍රජාවේ අනන්‍යතාවය තහවුරු කිරීමට වැදගත් වේ (Fishman, 1999,pp.152-163).

මුස්ලිම් ජනගහනයෙන් බහුතරය (90%කට වඩා වැඩි පිරිසක්) ශ්‍රී ලංකා යෝනක (Sri Lankan Moors) වන අතර ඔවුන්ගේ මූලාරම්භය ක්‍රි.ව. 7 වන සහ 8 වන සියවස්වල ඉන්දියන් සාගරයේ වෙළඳ සබඳතා සඳහා මෙරටට පැමිණි අරාබි සහ පර්සියානු වෙළෙන්දන් වෙත දිවයයි. කාලයාගේ ඇවෑමෙන් මෙම වෙළෙන්දන් මෙරට වෙරළබඩ ප්‍රදේශවල ස්ථාවරව පදිංචි වී, දේශීය සිංහල සහ දෙමළ කාන්තාවන් සමඟ විවාහ සබඳතා ඇති කර ගැනීමෙන් සුවිශේෂී අනන්‍යතාවක් සහිත ප්‍රජාවක් බිහි විය' 16 වන සියවසේදී පැමිණි පෘතුගීසි ලේඛනවල සහ පැරණි සිංහල සන්දේශ කාව්‍යවල (උදා: පරෙවි, ගිරා සන්දේශ) බේරුවල වැනි වෙරළබඩ නගරවල විසූ මුස්ලිම්වරුන් 'බබුරු' හෝ 'යෝනක' ලෙස හඳුන්වා ඇත.

යෝනකවරුන්ට අමතරව, ලන්දේසි යටත් විජිත සමයේදී (17-18 සියවස්) ඉන්දුනීසියාව සහ මැලේසියාව වැනි අග්නිදිග ආසියාතික රටවලින් සොල්දාදුවන් සහ පිටුවහල් කළවුන් ලෙස රැගෙන ආ පිරිසෙන් ශ්‍රී ලංකා මැලේ (Malays) ප්‍රජාව බිහි විය. බ්‍රිතාන්‍ය සමයේදී වෙළඳාම සඳහා ඉන්දියාවේ ගුජරාට් සහ දකුණු ඉන්දීය කලාපවලින් සංක්‍රමණය වූ මෙමන් (Memon), බෝහ්රා (Bohra) සහ ඉන්දියානු යෝනක ප්‍රජාවන් ද මෙරට මුස්ලිම් සමාජයේ කොටස්කරුවෝ වෙති. ශ්‍රී ලාංකීය මුස්ලිම් ජනයා යනු විවිධ භූගෝලීය කලාප, සංස්කෘතීන් සහ දේශීය ජන කොටස්වල සම්මිශ්‍රණයකින් සහ සහජීවනයෙන් පරිණාමය වූ සුවිශේෂී ජන ප්‍රජාවකි (Islam in Sri Lanka - Wikipedia)

5.3 මුස්ලිම් ජනවර්ගය සමඟ බැඳුණු දේශීය වෙදකම

ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික වෛද්‍ය පද්ධති අතර ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය චිකිත්සා (Ayurveda, Siddha, Unani සහ Desiya Chikithsa) ඇතුළත් වන අතර යුනානි වෛද්‍ය ක්‍රමය මුස්ලිම් ප්‍රජාව සමඟ ඓතිහාසිකව සම්බන්ධ වූ වෛද්‍ය පද්ධතියක් ලෙස හඳුනාගත හැකිය (Jones, 2020,p.9).

5.3.1 යුනානි වෛද්‍ය ක්‍රමයේ ආරම්භය

මුස්ලිම් ප්‍රජාව සමඟ සම්බන්ධ වූ යුනානි වෛද්‍ය ක්‍රමයේ මූලික සංකල්ප ග්‍රීක වෛද්‍ය සම්ප්‍රදාය සමඟ සම්බන්ධ වන අතර පසුව එය අරාබි-ඉස්ලාමීය ශිෂ්ටාචාරය තුළ විශාල වශයෙන් සංවර්ධනය විය. මධ්‍යකාලීන යුගයේ අරාබි වෙළඳුන් ඉන්දියාව සමඟත් පසුව ශ්‍රී ලංකාව සමඟත් වෙළඳ සබඳතා පැවැත්වූ අතර ඔවුන්ගෙන් ඇතැම් පිරිස් ශ්‍රී ලංකාවේ විශේෂයෙන් වෙරළබඩ ප්‍රදේශවල පදිංචි වූහ. එම සමාජ සම්බන්ධතා

සමඟ යුනානි වෛද්‍ය දැනුමද ශ්‍රී ලංකාව තුළ පැතිර යන ලදී. ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව යුනානි වෛද්‍ය දැනුම පවත්වාගෙන යාම, පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය කිරීම සහ ප්‍රායෝගිකව භාවිත කිරීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. මෙය වෛද්‍ය දැනුමක් පමණක් නොව ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාවේ සංස්කෘතික උරුමයේ කොටසක් ලෙසද සැලකිය හැකිය (The Faculty of indigenous Medicine, 2023: paragraph 2).

5.3.2 දෙනුවර ප්‍රදේශයේ මුස්ලීම් වෙද පරම්පරාව

දෙනුවර ප්‍රදේශය දේශීය වෙදකම් සම්ප්‍රදායන් හා පාරම්පරික වෛද්‍ය දැනුම සමඟ සම්බන්ධ වූ ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය. විශේෂයෙන්ම පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වූ දේශීය වෛද්‍ය දැනුම ආගමික හා ජනවාර්ගික සීමා ඉක්මවා විවිධ ජන කණ්ඩායම් අතර පැවති බව ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය ඉතිහාසය පිළිබඳ අධ්‍යයනයන්ගෙන් පැහැදිලි වේ. දේශීය වෙදකම හා ආයුර්වේදය පිළිබඳ සිංහල භාෂා ග්‍රන්ථ ද වර්තමානයේ ප්‍රකාශයට පත් වී ඇති අතර පාරම්පරික වෛද්‍ය ක්‍රම පිළිබඳ වෙනම ග්‍රන්ථ දක්නට ලැබේ. උඩරට රාජධානියේ රජුගේ බෙහෙත් ගෙය හෙවත් රාජකීය වෛද්‍ය සේවය සමඟ මුස්ලිම් වෛද්‍යවරුන් සම්බන්ධ වී සිටි බවට ඉතිහාස මූලාශ්‍ර සඳහන් කරයි. ඇතැම් මුස්ලිම් වෛද්‍ය පවුල් පරම්පරා ගණනාවක් පුරා රාජකීය වෛද්‍ය සේවයේ කටයුතු කළ අතර ඔවුන්ට ඉඩම් සහ රාජකීය තනතුරු ද පිරිනමා තිබුණි (Shukri 1986,pp.174-175).

දෙනුවර ප්‍රදේශයේ ජීවත් වන මුස්ලිම් වෙද පරම්පරාව මෙරට දේශීය වෙදකම් දැනුම පරම්පරාගතව රැකගෙන යන ප්‍රාදේශීය වෛද්‍ය සම්ප්‍රදායකට කදිම උදාහරණයකි. එම පරම්පරාවේ වෛද්‍ය දැනුම, ඖෂධ සකස් කිරීමේ ක්‍රම, රෝග හඳුනාගැනීමේ සාම්ප්‍රදායික ක්‍රම සහ ප්‍රතිකාර ක්‍රම පිළිබඳ තොරතුරු වාචික සම්ප්‍රදාය ඔස්සේ පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වීම ගැන නිරීක්ෂණය වුවකි. දෙනුවර වෛද්‍ය කටයුතු සඳහා බිහි වූ ප්‍රධාන මුස්ලිම් ජනාවාසයක් වශයෙන් වෙළම්බොඩ සැලකිය හැකිය. මෙම අය මහනුවර බුවැලිකඩ වෙද පරම්පරාවෙන් ගෙනවිත් පදිංචි කළ පිරිස් හැටියට සලකනු ලැබේ. ඔවුන් අතර සුප්‍රකට රාජකීය වෛද්‍යවරයෙකු වූ බුවැලිකඩ වෛද්‍යරත්න මුදියන්සේලාගේ අහමද් ලෙබ්බේ අබුබකර් පිල්ලෙයි ද වේ (අල්හාජ් හනීෆා, 2009,pp.475).

දෙනුවර ප්‍රදේශීය දේශීය වෛද්‍ය උරුමය විමiන විට එහි බහුසංස්කෘතික සමාජ පසුබිමක් පෙන්නුම් කරයි. මෙම මුස්ලිම් වෙද පරම්පරාවේ ඉතිහාසය, පරම්පරා අනුක්‍රමය සහ ප්‍රතිකාර ක්‍රම විමසීමේදී සිංහල ජනචාර්ගික සම්බන්ධතා පිළිබඳ තොරතුරු අනාවරණය වේ.

<u>එළදැත්ත - ලීමගහකොටුව වෙද පරම්පරාව</u>

වෛද්‍යරත්න මුදියන්සේලාගේ අබුබක්කර් පුල්ලේ

ඉස්මයිල් ලෙබ්බේ වෛද්‍යතුමා

අබ්දුර්රහ්මාන් ලෙබ්බේ වෛද්‍යතුමා

උදුමා ලෙබ්බේ වෛද්‍යතුමා

ආදම් ලෙබ්බේ වෛද්‍යතුමා

අබ්දුර් කාදර් ලෙබ්බේ වෛද්‍යතුමා

මුහම්මදු ලෙබ්බේ වෛද්‍යතුමා	සුලෙයිමාන් ලෙබ්බේ වෛද්‍යතුමා
1. වෛද්‍ය ජුනයිදීන් මහතා	1. මුහම්මදු යාසීන් මහතා
2. වෛද්‍ය සහාබ්දීන් මහතා	2. මුහම්මදු බෂීර් මහතා
3. ෆහුර්දීන් උඩයර් මහතා	3. මුහම්මදු තාසිම් මහතා
4. රවුස්දීන් උඩයර් මහතා	4. මුහම්මදු ඉර්ෂාද් මහතා
	5. මුහම්මදු සාදිකීන් මහතා
වෛද්‍යරත්න මුදියන්සේලාගේ ඩබ්ලිව්. එම්. ජුනයිදීන්	වෛද්‍යරත්න මුදියන්සේලාගේ ඩබ්ලිව්. එම්. එම්. ෂහාබ්දීන්

(මුහම්මදු හනීෆා 2017,p.95).

එළදැත්ත-ලීමගහකොටුව වෙද පරම්පරාව ශ්‍රී ලංකාවේ පාරම්පරික වෛද්‍ය දැනුම පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වූ ආකාරය පෙන්වන අවස්ථාවෙකි. මෙහි පරම්පරාගත තොරතුරුවලින් පෙනී යන්නේ මෙම වෛද්‍ය පරම්පරාවේ විකාශනයයි. මෙම පරම්පරාවේ මුල් පුරුෂයන් ලෙස වෛද්‍යරත්න මුදියන්සේලාගේ

අබුබක්කර් පුල්ලේ, ඉස්මයිල් ලෙබ්බේ වෛද්‍යතුමා, අබ්දුර්රහ්මාන් ලෙබ්බේ වෛද්‍යතුමා, උදුමා ලෙබ්බේ වෛද්‍යතුමා, ආදම් ලෙබ්බේ වෛද්‍යතුමා, අබ්දුර් කාදර් ලෙබ්බේ වෛද්‍යතුමා, මුහම්මදු ලෙබ්බේ වෛද්‍යතුමා සහ සුලෙයිමාන් ලෙබ්බේ වෛද්‍යතුමා යන නම් සඳහන් වේ. මෙම නම් මඟින් පරම්පරාව තුළ වෛද්‍ය දැනුම පවුල් සබඳතා ඔස්සේ පවත්වාගෙන ගිය බව පැහැදිලි වේ.

එමෙන්ම පරම්පරාවේ පසුකාලීන වෛද්‍යවරු මුහම්මදු ලෙබ්බේ වෛද්‍යතුමාගේ සහ සුලෙයිමාන් ලෙබ්බේ වෛද්‍යතුමාගේ යටතේ දැක්වෙන නම් හඳුනාගත හැකිය. මෙහිදී විශේෂයෙන් "උඩයර්" වැනි පදවි නාමයක් පරම්පරාවේ සමහර සාමාජිකයන් සමඟ සම්බන්ධ වීමෙන් ඔවුන්ගේ වෛද්‍ය භූමිකාවට අමතරව ප්‍රාදේශීය සමාජ-පරිපාලන තත්ත්වයක්ද තිබුණ බවට තොරතුරු අනාවරණය විය.

මෙම මුස්ලිම් වෛද්‍ය පරම්පරාවේ පවුල් නාම, සිංහල වාසගම් නාම සමඟ සම්බන්ධ වී තිබීම විශේෂත්වයකි. කලින් පෙන්වා දුන් පරිදි උඩරට රාජධානියට සංක්‍රමණය වූ මුස්ලිම්වරුන්ට රජුගේ නියෝගය පරිදි වංශවත් සිංහල කුල කාන්තාවන් විවාහ කර ගැනීම ihe එම අයගේ පෙළපත් නාමය මොවුන් විසින් භාවිතයට ගැනීම යන කාරණය මෙයින් ප්‍රත්‍යක්ෂ වෙයි.

ඒ අනුව එළදැත්ත-ලීමගහකොටුව වෙද පරම්පරාව යනු එක් පුද්ගලයෙකුගේ වෛද්‍ය සේවාවකට සීමා වූවක් නොව, පවුල් පරම්පරා කිහිපයක් හරහා වෛද්‍ය දැනුම, වෘත්තීය අනන්‍යතාව සහ සමාජ තත්ත්වය සම්ප්‍රේෂණය වූ පාරම්පරික වෛද්‍ය උරුමයක් වන බැව් පැහැදිලි වෙයි. සිංහල සහ මුස්ලිම් නාමකරණ සම්ප්‍රදායන් එකම වෛද්‍ය පරම්පරාවක් තුළ දැකගත හැකි වීම විශේෂ වූවකි.

<u>දස්කර වෙද පරම්පරාව</u>

දස්කර වෛද්‍යරත්න මුදියන්සේලාගේ අහමදු ලෙබ්බේ අබුබක්කර් පුල්ලේ

(ක්‍රි.පූ. 1786) නාමාවලිය

අහමදු ලෙබ්බේ අබුබක්කර් පුල්ලේ මහතා

වෛද්‍ය ආදම් ලෙබ්බේ මහතා

වෛද්‍ය ඉස්මායිල් ලෙබ්බේ මහතා

වෛද්‍ය අබ්දුල් රහ්මාන් ලෙබ්බේ මහතා

වෛද්‍ය උදුමාන් ලෙබ්බේ මහතා (දස්කර ලොකු වෙදරාළ)
වෛද්‍ය නූර් මොහොමඩ් මහතා- (දෙල්ලංග) යු. එල්.ජමාල්දීන් මහතා (දස්කර)
වෛද්‍ය දුර්දීන් මහතා සහ වෛද්‍ය ඩබ්ලිව්. එම්.බී.එම්. මහරූප් මහතා (දස්කර)
(මුහම්මදු හනීෆා 2017).

දස්කර ප්‍රදේශයේ පාරම්පරික වෛද්‍ය දැනුම පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වූ දේශීය වෛද්‍ය උරුමයක් ලෙස හඳුනාගත හැකිය. මෙම වෛද්‍ය පරම්පරාවේ ආරම්භය දස්කර වෛද්‍යරත්න මුදියන්සේලාගේ අහමදු ලෙබ්බේ අබුබක්කර් පුල්ලේ වෙතින් සිදුවන බව සඳහන් වේ. මෙම පරම්පරාගත වෛද්‍ය දැනුම පවුල් සම්ප්‍රදායක් ලෙස පමණක් නොව ප්‍රාදේශීය සමාජය තුළ රෝග නිවාරණය හා ප්‍රතිකාර සඳහා භාවිත වූ දැනුම් පද්ධතියක් ලෙසද සැලකිය හැකිය. මෙහි වෛද්‍ය උදුමාන් ලෙබ්බේ ''දස්කර ලොකු වෙදරාළ" යන ගෞරව නාමයෙන් හඳුන්වා තිබීම විශේෂ වැදගත්කමක් දරයි. එම නාමය ඔහු ප්‍රදේශයේ වෛද්‍ය ප්‍රතිකාර ක්ෂේත්‍රය තුළ දැරූ සමාජීය හා වෘත්තීය වැදගත්කම පිළිබඳ ඉඟියක් සපයයි. ඉන් අනතුරුව වෛද්‍ය නූර් මොහොමඩ් දෙල්ලංග ප්‍රදේශය සමඟත්, යු. එල්. ජමාල්දීන් දස්කර ප්‍රදේශය සමඟත් සම්බන්ධ වන අතර වෛද්‍ය බදුර්දීන් සහ වෛද්‍ය ඩබ්ලිව්. එම්. බී. එම්. මහරූප් යන පරම්පරාගත වෛද්‍යවරුන් හරහා මෙම වෛද්‍ය දැනුම අඛණ්ඩව පවත්වාගෙන ආහ (මුහම්මදු හනීෆා, 2017,p.97).

මෙම පරම්පරාව විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ දස්කර ප්‍රදේශයේ තිබෙන දේශීය වෙදකම පිළිබඳ දැනුම බෙහෙවින්ම පවුල් ඒකකය, ගම හා වෘත්තීය භූමිකාව යන අංශ තුන සමඟ බැඳී වර්ධනය වී ඇති බවයි. විශේෂයෙන්ම "වෙදරාළ" සහ " වෛද්‍ය" යන හැඳින්වීම් භාවිත වීමෙන් පාරම්පරික වෛද්‍ය දැනුම සමාජයේ පිළිගත් වෘත්තීය ක්‍රියාවලියක් බවට පත්ව තිබූ බව පෙන්වා දිය හැකිය.

සිංහල වාසගම් සහිත මෙම මුස්ලිම් වෙද පරම්පරාව අතීත රාජ්‍ය පාලන යුගයේ රජවරුන් යටතේ වෛද්‍ය සේවාව ලබාදුන් බවට තොරතුරු දැක්වේ. ඒ අනුව

1. වෛද්‍යරත්න ගෝපාල මුදලිගේ අන්සාර් ඉබ්නු තුෆයිල් උඩයාර් (1234-1269) දඹදෙණි යුගයේ දෙවන පරාක්‍රම රජ
2. රාජකරුණා වෛද්‍යතිලක ගෝපාල මුදලිගේ ෂේහු ෂරීෆ් ඉබ්නු අහමඩ් තුෆයිල් (1357-1374) ගම්පොල යුගයේ තුන්වන විජයබාහු රජ

3. රාජකරුණා රාජවෛද්‍ය දිවුරුම්පොල ගෝපාල මුදියන්සේලාගේ ෂේක් සාලි ඉබ්නු ස්මයිල් උඩයාර් (1412-1468) ගම්පොල යුගයේ හතරවන පරාක්‍රමබාහු රජ
4. රාජකරුණා වෙහන්ගෝපාල දූවගොඩ මුදියන්සේලාගේ ෂේක් සල්දීන් ඉබ්නු අත්තාස් තුෆයිල් උඩයාර් (1590-1604) මහනුවර යුගයේ පළමුවන විමලධර්මසූරිය රජ
5. වෛද්‍යතිලක රාජකරුණා සෙනරත් මුදලිගේ මුහම්මද් අලි ඉබ්නු තාසිම් උඩයාර් (1604-1635) මහනුවර යුගයේ සෙනරත් රජ
6. පල්කුඹුර වෛද්‍යතිලක රාජකරුණා ගෝපාල මුදියන්සේලාගේ ෂේක් මුහම්මද් උඩයාර් ඉබ්නු අලි ඉබ්නු තුයිෆල් (1629-1687) මහනුවර යුගයේ රාජසිංහ රජ
7. රාජකරුණා ගෝපාල මුදියන්සේලාගේ මුහම්මද් උඩයාර් සුල්තාන තුෆයිල් (1687-1707) මහනුවර යුගයේ දෙවන විමලධර්මසූරිය රජ
8. පල්කුඹුර වෛද්‍යතිලක රාජකරුණා ගෝපාල මුදියන්සේලාගේ අබ්දුල් කාදර් උඩයාර් අමද් උඩයාර් (1747-1780) මහනුවර යුගයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ
9. ගැටඹේරිය වෛද්‍යතිලක රාජකරුණා මුදියන්සේලාගේ මදාර් උඩයාර් (1780-1798) මහනුවර යුගයේ රාජාධිරාජසිංහ රජ
10. ගැටඹේරිය හාජි මුහුන්දිරම් පල්කුඹුර වෛද්‍යතිලක රාජකරුණා ගෝපාල මුදියන්සේලාගේ මුහම්මද් උඩයාර් (1798-1815) මහනුවර යුගයේ ශ්‍රී වික්‍රම රාජසිංහ රජ (මුහම්මදු හනීෆා 2017,pp.98-99).

මෙම පරම්පරා අනුක්‍රමය දෙස බලන විට දඹදෙණි යුගයේ සිට මහනුවර යුගයේ අවසානය දක්වා මුස්ලිම් වෛද්‍යවරුන් රාජකීය වෛද්‍ය සේවය සමඟ සම්බන්ධ වූ බවට සාම්ප්‍රදායික තොරතුරු ඉදිරිපත් කෙරේ. මුහම්මදු හනීෆා (2017) විසින් වෛද්‍යරත්න ගෝපාල මුදලිගේ අන්සාර් ඉබ්නු තුෆයිල් උඩයාර් දෙවන පරාක්‍රමබාහු රජුගේ සමයේත්, රාජකරුණා වෛද්‍යතිලක ගෝපාල මුදලිගේ ෂේහු ෂරීෆ් ඉබ්නු අහමඩ් තුෆයිල් තුන්වන විජයබාහු රජුගේ සමයේත් වෛද්‍ය සේවය ලබාදුන් බව සඳහන් කරයි. එසේම දිවුරුම්පොල ගෝපාල මුදියන්සේලාගේ ෂේක් සාලි ඉබ්නු ස්මයිල් උඩයාර් වැනි පුද්ගලයන් රාජවෛද්‍ය යන ගෞරව නාමය දරමින් කටයුතු කළ බව දක්වා ඇත. මේවා සලකා බැලීමේදී මුස්ලිම් වෛද්‍යවරුන්ගේ වෘත්තීය භූමිකාව රාජකීය පවුලට පමණක් සීමා වූවක් නොව, රාජ්‍ය අනුග්‍රහය සහ සමාජ පිළිගැනීම සමඟ සම්බන්ධ වූ විශේෂිත වෘත්තීය තත්ත්වයක් ලෙස පැවති බව තර්ක කළ හැකිය.

මහනුවර රාජධානි සමයේදී මෙම සම්බන්ධතාව තවදුරටත් පැහැදිලි වන අතර වෛද්‍ය පරම්පරාවන් කිහිපයක් රාජකීය වෛද්‍යවරුන් ලෙස හඳුනාගෙන තිබේ. පළමුවන විමලධර්මසූරිය, සෙනරත්, රාජසිංහ, දෙවන විමලධර්මසූරිය, කීර්ති ශ්‍රී රාජසිංහ, රාජාධිරාජසිංහ සහ ශ්‍රී වික්‍රම රාජසිංහ යන රජවරුන්ගේ සමයන්ට අදාළව ෂේක් සල්දීන් ඉබ්නු අත්තාස් තුෆයිල් උඩයාර්, මුහම්මද් අලි ඉබ්නු තාසිම් උඩයාර්, ෂේක් මුහම්මද් උඩයාර්, මුහම්මද් උඩයාර් සුල්තාන තුෆයිල්, අබ්දුල් කාදර් උඩයාර් අමද් උඩයාර්, මදාර් උඩයාර් සහ මුහම්මද් උඩයාර් වැනි නාම සඳහන් වේ. විශේෂයෙන් පල්කුඹුර සහ ගැටබේරිය වැනි ස්ථාන නාම සමඟ මෙම පවුල් නාම හා වෛද්‍ය ගෞරව නාම සම්බන්ධ වීමෙන් මෙම වෛද්‍ය පරම්පරාවන් ප්‍රදේශීය වශයෙන් ද සංවිධානාත්මක හා පරම්පරාගත වෘත්තීය සම්ප්‍රදායක් පවත්වාගෙන ගිය බවට ඉඟියක් ලැබේ. එමෙන්ම මුදලි, මුදියන්සේලාගේ, උඩයාර් වැනි පද භාවිතය මඟින් ඔවුන්ගේ වෘත්තීය තත්ත්වය රාජකීය පරිපාලන ව්‍යුහය හා සම්බන්ධ වූ ආකාරය අවබෝධ කරගත හැකිය.

ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ මුස්ලිම් ප්‍රජාව සහ සිංහල රාජකීය සමාජය අතර පැවති අන්තර්සම්බන්ධතා පිළිබඳ වැදගත් සාක්ෂ්‍යයක් ලෙස මෙය සැලකිය හැකිය. සිංහල වාසගම් සහ රාජකීය ගෞරව නාම භාවිත කළ මුස්ලිම් වෛද්‍ය පරම්පරාවන්ගේ පැවැත්මෙන් පෙනී යන්නේ එවකට සමාජ අනන්‍යතාවය ආගමික අනන්‍යතාවයෙන් පමණක් නිර්ණය නොවූ අතර වෘත්තිය, රාජකීය සේවය, භූගෝලීය සම්බන්ධතා සහ පරිපාලන තත්ත්වය ද එයට බලපා ඇති බවයි. එබැවින් මෙම වෛද්‍ය පරම්පරාවන් ශ්‍රී ලංකාවේ දේශීය වෛද්‍ය දැනුම සංරක්ෂණය කිරීමේදී මෙන්ම රාජකීය වෛද්‍ය සේවය පවත්වාගෙන යාමේදී ද දායක වූ බහුසංස්කෘතික සමාජ කණ්ඩායමක් ලෙස හඳුනා ගත හැකිය.

5.4 උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රැකියා

වගු සටහන 1 අනුව උඩුනුවර ප්‍රදේශයේ වාර්තාගත රැකියා නියුක්ති සංඛ්‍යාව ආසන්න වශයෙන් 50,030ක් වේ. එහි වැඩිම නියෝජනයක් දක්වන්නේ ආරක්ෂක අංශයේ රැකියා වන අතර එය 16,800ක් හෙවත් සමස්තයෙන් ආසන්න වශයෙන් 33.6%කි. මෙය උඩුනුවර ප්‍රදේශයේ රැකියා ව්‍යුහය තුළ ආරක්ෂක සේවයට සැලකිය යුතු වැදගත්කමක් පවතින බව පෙන්වයි. ශ්‍රී ලංකාවේ පැවති සිවිල් යුද්ධය මෙරට රැකියා වියුක්තිය විසඳුමක් වූ බව විවිධ ප්‍රකාශන මඟින් හෙළිකර ඇත.

වගුව 01

දෙනුවර පළාතේ රැකියා නියුක්තිය- 2022

උඩුනුවර ප්‍රා. ලේ. කොා.		යටිනුවර ප්‍රා. ලේ. කොා.	
රැකියාව	**සංඛ්‍යාව**	**රැකියාව**	**සංඛ්‍යාව**
විධායක/ කළමණාකරණ	1,133	විධායක/ කළමණාකරණ	2,374
ලිපිකරු	5,583	ලිපිකරු	3,225
තාක්ෂණිකයින් (කාර්මික)	2,038	කාර්මික	22,005
ආරක්ෂක අංශය	16,800	ආරක්ෂක අංශය	2,642
විදේශ රැකියා	-	විදේශ රැකියා	1,947
ශිල්පීය ආශ්‍රිත රැකියා	3,220	පෙදරේරු	1,397
		වඩු	561
ඡාන විද්‍යාව හා ධීවර (සත්ව පාලන)	3,519	සත්ව පාලන	932
සේවා හා විකුණුම් ආශ්‍රිත (වෙළඳ)	4,550	වෙළඳ ව්‍යාපාරික	2,612
ශිල්පීය ආශ්‍රිත කර්මාන්ත	3,220	ඇඟළුම්	1,889
මූලික රැකියාවන්	9,967	කම්කරු	10,062
		කෘෂිකාර්මික	5,463
		ඉඩම් හිමි වැවිලි	1,413
	-	වෙනත්	9,186

මූලාශ්‍ර: උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය වාර්ෂික වාර්තා දත්ත, 2021
යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය වාර්ෂික වාර්තා දත්ත, 2022

ශ්‍රී ලංකාවේ සිවිල් යුධ ගැටුම රාජ්‍ය අංශයේ රැකියා වර්ධනයට සැලකිය යුතු ලෙස දායක වී තිබේ. ආර්ක්ෂක හමුදාවන්ට බඳවා ගැනීම රැකියා අවස්ථා සඳහා විශාලතම මූලාශ්‍රවලින් එකක් බවට පත් විණි. මෙමඟින් මූලික අධ්‍යාපනයක් සහිත ග්‍රාමීය තරුණයන් සඳහා වැඩි අවකාශ හිමි විය. එම කාලයේ ශ්‍රී ලංකාවේ හමුදා සාමාජිකයන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 240,000ක් විය (World Bank 1999,p.22). තවත් අවස්ථාවක පෙන්වා දෙන්නේ රජයේ හමුදා රැකියා 18-30 වයස් කාණ්ඩයේ සිංහල බෞද්ධ පිරිමි තරුණයන් අතර විශේෂයෙන් සංකේන්ද්‍රණය වී තිබූ බවයි. එහි තවදුරටත් සඳහන් වන්නේ ද්විතීයික අධ්‍යාපනය අවසන් කර ඇති නමුත් උසස් අධ්‍යාපනයක් නොමැති රැකියා විරහිත වීමේ වැඩි අවදානමක් ඇති තරුණ සිංහල පිරිමින් අතර හමුදා සේවය සමස්ත රැකියා වලින් 17%ක් පමණ නියෝජනය කළ බවයි (Venugopal, 2014,p.87).

අංක 1 වගුවේ දත්ත අනුව මූලික රැකියාවන් 9,967ක් (19.9%) සහ ලිපිකරු රැකියා 5,583ක් (11.2%) ලෙස දැක්වේ. සේවා හා විකුණුම් ආශ්‍රිත රැකියා 4,550ක් පමණ වන අතර ශිල්පීය ආශ්‍රිත හා කෘෂිකාර්මික/සත්ව පාලන ආශ්‍රිත රැකියාද සැලකිය යුතු මට්ටමක පවතී. එමගින් උඩුනුවර රැකියා ව්‍යුහය සේවා අංශය, මූලික හෝ අර්ධ-පුහුණු රැකියා සහ ආරක්ෂක සේවා මත සැලකිය යුතු ලෙස රඳා පවතින බව පෙනේ.

5.5 යටිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රැකියා

යටිනුවර ප්‍රදේශයේ රැකියා නියුක්තිය ආසන්න වශයෙන් 65,708ක් පමණ වන බව වගුවෙන් දැක්වේ. මෙහි වඩාත් කැපී පෙනෙන රැකියා කාණ්ඩය වන්නේ කාර්මික රැකියා වන අතර එය 22,005ක් හෙවත් ආසන්න වශයෙන් 33.5%කි. එබැවින් යටිනුවර ප්‍රදේශයේ රැකියා ව්‍යුහය උඩුනුවරට වඩා කාර්මික හා නිෂ්පාදන ආශ්‍රිත ස්වභාවයක් දක්වන බව පෙනේ.

එමෙන්ම කම්කරු රැකියා 10,062ක් (15.3%) සහ වෙනත් රැකියා 9,186ක් (14.0%) ලෙස වාර්තා වේ. කෘෂිකාර්මික රැකියා 5,463ක් (8.3%) වන අතර විධායක හෝ කළමනාකරණ රැකියා 2,374ක් සහ ලිපිකරු රැකියා 3,225ක් වේ. තවද විදේශ රැකියා 1,947ක් ලෙස දැක්වීම විශේෂත්වයකි. මෙය යටිනුවර ජනතාවගේ රැකියා අවස්ථා දේශීය කාර්මික හා සේවා අංශයට පමණක් සීමා නොවන බව පෙන්වයි.

උඩුනුවර ප්‍රදේශයේ රැකියා ව්‍යුහය ආරක්ෂක සේවා සහ මූලික හෝ සේවාමය රැකියා කෙරෙහි වැඩි අවධානයක් දක්වන අතර යටිනුවර ප්‍රදේශයේ කාර්මික හා කම්කරු රැකියා වඩාත් ප්‍රමුඛ වේ. යටිනුවර ප්‍රදේශයේ කාර්මික රැකියා සංඛ්‍යාව 22,005ක් වීම එහි රැකියා ව්‍යුහයේ ප්‍රධාන ලක්ෂණය ලෙස හඳුනාගත හැකිය.

පොදුවේ බලන විට දෙනුවර ප්‍රදේශයේ රැකියා නියුක්තිය ඒකාකාරී නොවන අතර උඩුනුවර හා යටිනුවර අතර රැකියා ව්‍යුහයේ සැලකිය යුතු භේදයක් පවතී. මෙයට මූලික හේතු ලෙස අධ්‍යයනයෙන් නිරීක්ෂණය වූයේ ප්‍රදේශ දෙකෙහි භූගෝලීය පිහිටීමේ වෙනස්කම් මෙන්ම ආර්ථික හා සමාජ සාධක වලින් වැඩි බලපෑ තිබෙන බවයි. විශේෂයෙන්ම යටිනුවර ප්‍රදේශයට සාපේක්ෂව උඩුනුවර ප්‍රදේශය පිහිටීමේ භූගෝලීය දුෂ්කරතා මෙන්ම වැඩි ග්‍රාමීය නැඹුරුව දක්නට ලැබේ. එසේම සාපේක්ෂ අඩු අධ්‍යාපන

තත්ත්වය, රැකියා වියුක්තිය හා සමාජ සම්බන්ධතාව, ඌණතාවය දක්නට ලැබේ. මෙය හොඳින් පෙන්වන අවස්ථාව ලෙස යටිනුවර වැඩිම රැකියා නියුක්තිය කාර්මික අංශයෙන් (22,005) පෙන්වා තිබෙන අතර අතර එය උඩුනුවර දී වැනි අඩු අගයක් (2,038) ගෙන ඇත.

5.6 උඩුනුවර දේශීය කර්මාන්තවල භූගෝලීය හා සංස්කෘතික විශේෂත්වය

උඩුනුවර ප්‍රදේශය තුළ විවිධ ගම්මානවලට විශේෂිත වූ දේශීය කර්මාන්ත ව්‍යාප්ත වී තිබීම එම ප්‍රදේශයේ ඓතිහාසික හා සංස්කෘතික අනන්‍යතාවය පිළිබිඹු කරන වැදගත් ලක්ෂණයකි. කන්දේගම (2009) පෙන්වා දෙන පරිදි ගඩලාදෙණිය, කිරිවවු හා පමුණුව ප්‍රදේශ පිත්ත කර්මාන්තයටත්, ඇම්බැක්කේ ලී කැටයම් කර්මාන්තයටත්, කුරගල බෙර හා රබන් නිෂ්පාදනයටත්, අරත්තන පිත්තල වාස්තු කැටයම් සඳහාත් විශේෂත්වයක් දක්වයි. එමෙන්ම කුරුකුත්ත, කම්මල් වැඩ, හන්දෙස්ස කුළු කර්මාන්තය, පැණිදෙණිය රිදී වැඩ සහ වැලිගල්ල ඇලුමිනියම් කර්මාන්තය සඳහා ප්‍රසිද්ධ වී ඇත. විශේෂයෙන් කිරිවවුල හා අවට උඩුනුවර ගම්මාන කිහිපයක පිත්තල කර්මාන්තය පරම්පරාගතව පැවතී ඇති අතර පසුකාලීනව එය ගඩලාදෙණිය හා පමුණුව වැනි ප්‍රදේශවලටද ව්‍යාප්ත වී ඇත (Luckman and Thomas, 2023,pp.65-95).

උඩුනුවර දේශීය කර්මාන්ත හුදෙක් ආදායම් උපයන ක්‍රමයක් පමණක් නොව පරම්පරාගත දැනුම, කලාත්මක හැකියාව සහ ප්‍රදේශීය අනන්‍යතාව එකට බැඳුණු සංස්කෘතික උරුමයක් ලෙසද සැලකිය හැකිය.

5.7 උඩුනුවර දේශීය කර්මාන්ත නැඹුරුව සහ කුල සම්බන්ධතාව

ශ්‍රී ලංකාවේ විශේෂයෙන් කන්ද උඩරට සමාජ ව්‍යුහය තුළ වෘත්තිය හා කුලය අතර ඓතිහාසික සම්බන්ධතාව ඉතා පැහැදිලිව දැකගත හැකිය. කන්ද උඩරට රාජකාරි ක්‍රමය යටතේ විවිධ සමාජ කණ්ඩායම්වලට විශේෂිත සේවා හා වෘත්තීය කාර්යයන් පැවරී තිබූ අතර නවන්දන (ආචාරි) කුලයට අයිති කණ්ඩායම් ලෝහ වැඩ, කම්මල් වැඩ, රන් හා රිදී වැඩ වැනි තාක්ෂණික ශිල්ප සමඟ සම්බන්ධ වී සිටියහ (Witharana,2019,p.166), එසේම බෙරවා කුලයට අයිති (නැකති) කණ්ඩායම සාම්ප්‍රදායිකව බෙර වාදනය හා චාරිත්‍රානුකූල සේවා සමඟ සම්බන්ධ වූ අතර, එම වෘත්තීය අනන්‍යතාවය කුල අනන්‍යතාව සමඟ ද සම්බන්ධ වී තිබුණි (Simpson and de Silva, 2025,p.37).

උඩුනුවර කම්මල් වැඩ, බෙර නිෂ්පාදනය, පිත්තල හා රිදී වැඩ වැනි කර්මාන්තවල ප්‍රාදේශීය සංකේන්ද්‍රණය හුදෙක් ස්වාභාවික සම්පත් හෝ වෙළෙඳපොළ අවශ්‍යතාව මත පමණක් ඇති වූවක් නොව, ඓතිහාසික වෘත්තීය බෙදීම හා පරම්පරාගත කුල ව්‍යුහයද එයට බලපා ඇති බව විග්‍රහ කළ හැකිය.

5.8 කුල විෂමතාව සහ වෘත්තීය සීමා

වෘත්තීය කුල සම්බන්ධතාව මඟින් උඩුනුවර ප්‍රදේශවල සමාජ සංචලනයට සීමා ඇති වීමට ඉඩ තිබූ බවද පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ කුල ක්‍රමය ඉන්දියානු කුල ක්‍රමයට සමාන ආකාරයකින් පමණක් නොව, රාජකාරි, ඉඩම් හිමිකම, සේවා බැඳීම් සහ වෘත්තීය අනන්‍යතාව මත පදනම් වූ ස්වදේශීය ස්වරූපයකින් වර්ධනය වී ඇත. එහිදී සම්ප්‍රදායික වෘත්තියක් පරම්පරාවෙන් පරම්පරාවට ගෙන යාම සමාජ අනන්‍යතාවයේ කොටසක් වූ අතර, ඇතැම් කණ්ඩායම්වලට පහළ සමාජ තත්ත්වයක් ආරෝපණය වීමද සිදු විය (Simpson & de Silva, 2025,p.36).

වර්තමාන මෙම අධ්‍යයනයෙන් පැහැදිලි වන්නේ සාම්ප්‍රදායික කුල වෘත්තීන් අත්හැරීම මඟින් පහළ කුලවල පුද්ගලයන් සමාජ හා ආර්ථික සංචලනය සොයා ගිය බවයි. සාම්ප්‍රදායික කුල වෘත්තීය හා පවුල් නාමය වැනි සමාජ සලකුණු ඇතැම් අවස්ථාවලදී සමාජ ඉහළ යාමට බාධාවක් වූ අතර, නව රැකියා, නාගරීකරණය සහ අධ්‍යාපනය හරහා එම සීමා අඩු කරගැනීමට උත්සාහ කර ඇති බව පෙන්වා දෙයි (de Silva, 2018, pp.303-325). එබැවින් උඩුනුවර කර්මාන්ත ප්‍රදේශීය වශයෙන් සාර්ථක වුවද, එම කර්මාන්ත සමඟ සම්බන්ධ වූ සමාජ කණ්ඩායම්වලට අතීතයේදී සමාජ තත්ත්වය හා වෘත්තීය තේරීම් සම්බන්ධයෙන් සීමාවන් පැවති බව සැලකිය හැකිය.

5.9 කුල පීඩනය, නව රැකියා සහ හමුදා සේවය

උඩුනුවර ප්‍රදේශයේ සාම්ප්‍රදායික කුල-වෘත්තීය සම්බන්ධතා නවීන රැකියා වෙළෙඳපොළ සමඟ වෙනස් වීම පිළිබඳව කරුණු හඳුනාගත හැකිය. සාම්ප්‍රදායික වෘත්තීන්හි පැවති සමාජ අපකීර්තිය හේතුවෙන් තරුණ පරම්පරාව එම වෘත්තීන්ගෙන් ඉවත්ව අධ්‍යාපනය, නාගරික රැකියා සහ වෙනත් ආයතනික රැකියා වෙත යොමු වීම ශ්‍රී ලංකාවේ වෙනත් ප්‍රදේශ සම්බන්ධයෙන්ද හඳුනාගෙන ඇත. බෙරවා කුලයට අයිති ප්‍රජාව පිළිබඳ පර්යේෂණයකි පෙන්වා දෙන්නේ සාම්ප්‍රදායික වෘත්තීන්ගෙන් ඉවත්වීමේදී හමුදා

සේවය ඇතුළු නව රැකියා අවස්ථා වැදගත් ගමනාන්තයක් වූ බවයි (Simpson & de Silva 2025, pp.46-48).

උඩුනුවර හමුදා ආශ්‍රිත රැකියා නියුක්තිය ඉහළ යාමට කුල පීඩනයද එක් සාධකයක් විය හැකි බව උපකල්පනය කළ හැකිය. එසේම සාම්ප්‍රදායික කුල වෘත්තීය බැඳීම් ලිහිල් වීමත් සමඟ නව රැකියා වෙත සංක්‍රමණය වීම, උඩුනුවර සමාජයේ වෘත්තීය ව්‍යුහය වෙනස් වීමට හේතු වී ඇති බව පෙන්වා දිය හැකිය. මේ අනුව, උඩුනුවර දේශීය කර්මාන්ත යනු ආර්ථික ක්‍රියාකාරකමක් පමණක් නොව කුලය, සමාජ තත්ත්වය, පරම්පරාගත දැනුම සහ නවීන වෘත්තීය සංචලනය අතර සම්බන්ධතාව විග්‍රහ කළ හැකි වැදගත් සමාජමය හා භූගෝලීය දර්ශකයක් ලෙස සැලකිය හැකිය.

6. නිගමනය

මෙම අධ්‍යයනය මඟින් දෙනුවර ප්‍රදේශයේ සිංහල හා මුස්ලිම් ih එහි ජනප්‍රජාවන්ගේ ඓතිහාසික පැවැත්ම, සමාජීය සහජීවනය, සංස්කෘතික අන්තර්ක්‍රියා, අධ්‍යාපනය, දේශීය වෛද්‍ය උරුමය සහ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ විග්‍රහ කරනු ලැබීය. අධ්‍යයනයෙන් අනාවරණය වූ ප්‍රධාන කරුණක් වන්නේ දෙනුවර ප්‍රදේශය හුදෙක් ජනවාර්ගික හා ආගමික වශයෙන් විවිධ වූ භූගෝලීය ප්‍රදේශයක් පමණක් නොව, දිගුකාලීන සමාජ සම්බන්ධතා, අන්‍යෝන්‍ය සහයෝගිතාව සහ සංස්කෘතික හුවමාරුව මත ගොඩනැඟුණු සමාජයක් ද වන බවයි. උඩුනුවර හා යටිනුවර ප්‍රදේශවල සිංහල හා මුස්ලිම් ජනතාවගේ ඓතිහාසික පැවැත්ම විමසා බැලීමේදී, මෙම ප්‍රජාවන් අතර සබඳතා නූතන යුගයට පමණක් සීමා නොවී අතීත රාජ්‍ය පාලන යුග වෙත දිවෙයි.

මහනුවර රාජධානිය ඇතුළු පැරණි රාජ්‍ය පාලන සමයන්හිදී මුස්ලිම් ජනතාව වෙළෙඳාම, වෛද්‍ය සේවය සහ වෙනත් වෘත්තීය ක්ෂේත්‍ර ඔස්සේ ප්‍රාදේශීය සමාජයට දායක වී ඇත. රාජකීය වෛද්‍ය සේවය සමඟ සම්බන්ධ වූ මුස්ලිම් වෛද්‍ය පරම්පරාවන්, සිංහල වාසගම් හා රාජකීය ගෞරව නාම භාවිතය සහ පරම්පරාගත වෛද්‍ය දැනුම පවත්වාගෙන යාම ඒ සඳහා වැදගත් සාක්ෂි ලෙස සැලකිය හැකිය. එළදැත්ත-ලීමගහකොටුව සහ දස්කර වෛද්‍ය පරම්පරාවන් පිළිබඳ තොරතුරු මඟින් දේශීය වෛද්‍ය දැනුම පවුල් පරම්පරා ඔස්සේ සම්ප්‍රේෂණය වූ ආකාරය මෙන්ම, වෘත්තීය අනන්‍යතාව, රාජකීය අනුග්‍රහය සහ ප්‍රාදේශීය සමාජ පිළිගැනීම අතර පැවති සම්බන්ධතාව ද පැහැදිලි වේ. එමඟින් දෙනුවර ප්‍රදේශයේ ඉතිහාසය විමසීමේදී

ජනවාර්ගික අනන්‍යතාව පමණක් නොව වෘත්තිය, සමාජ තත්ත්වය සහ ඓතිහාසික සබඳතා ද සැලකිල්ලට ගත යුතු බව තහවුරු වේ.

සිංහල හා මුස්ලිම් ජනතාව අතර අතීතයේ පැවති සමීප සමාජ සබඳතා දෛනික ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වීම විශේෂිත දෙයකි. විවාහ මංගල්‍ය වැනි පවුල්මය අවස්ථාවලදී එකිනෙකාට ආරාධනා කිරීම, විශේෂිත උත්සව අවස්ථාවලදී ආහාර හුවමාරු කරගැනීම, අසල්වැසි සබඳතා පවත්වාගෙන යාම සහ එකිනෙකා ඥාති සබඳතා දැක්වෙන ආමන්ත්‍රණ පදවලින් ඇමතීම වැනි ක්‍රියාකාරකම් මඟින් අන්‍යෝන්‍ය පිළිගැනීම සහ සමාජීය සමීපතාව පිළිබිඹු වේ. එහෙත් මෙම සහජීවනය සැමවිටම ගැටුම්වලින් තොර වූවක් ලෙස අර්ථකථනය කළ නොහැකිය. දේශපාලන බල තරඟ, ජනවාර්ගික වෙනස්කම් දේශපාලනිකව භාවිත කිරීම සහ ප්‍රජා අතර අවිශ්වාසය වර්ධනය වීම වැනි සාධක මඟින් එම සබඳතා දුර්වල විය හැකි බව ද පෙන්වා දිය හැකිය. ජනවාර්ගික හා ආගමික විවිධත්වයම ගැටුම්වලට හේතුවක් වනවා වෙනුවට එම වෙනස්කම් සමාජ හා දේශපාලන ක්‍රියාවලීන් තුළ පෞද්ගලික පරමාර්ථ වෙනුවෙන් භාවිතයට ගැනීම ගැටුම් ඇතිවීමට බලපා තිබේ.

දෙනුවර ප්‍රදේශයේ ජනවාර්ගික සබඳතා ගොඩනැඟීමේදී පාසල්, පුස්තකාල සහ වෙනත් අධ්‍යාපනික පසුබිමෙන් වැඩි දායකත්වය ලබා දී තිබේ. ජනවාර්ගික පදනම මත පාසල් වෙන්ව පැවතීම විවිධ ප්‍රජාවන් අතර දෛනික අන්තර්ක්‍රියා සීමා කිරීමට ඉඩ ඇති නමුත්, සිංහල හා මුස්ලිම් දරුවන් එකම පුස්තකාලයකදී කියවීම්, භාෂාමය ක්‍රියාකාරකම් සහ තරඟ සඳහා සහභාගී වීම තුළින් අන්‍යෝන්‍ය අවබෝධය වර්ධනය කර ගැනීමට අවස්ථා උදාවී ඇත. විශේෂයෙන් සිංහල භාෂාව පිළිබඳ මුස්ලිම් සිසුන්ගේ දැනුම සහ භාෂාමය ක්‍රියාකාරකම්වල බහුසංස්කෘතික සමාජයක සන්නිවේදනය සඳහා භාෂා දැනුමේ වැදගත්කම පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, භාෂා දෙකම ඉගෙනීමේ අවස්ථා සමානව නොලැබීම අන්තර්ප්‍රජා සන්නිවේදනයට බාධාවක් විය හැකි බැවින් ද්විභාෂා හා බහුභාෂා අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සුදුසු ය.

දෙනුවර ප්‍රදේශයේ රැකියා ව්‍යුහය සහ දේශීය කර්මාන්ත විමසීමෙන් උඩුනුවර හා යටිනුවර අතර ආර්ථික හා වෘත්තීය වෙනස්කම් පවතින බව හඳුනාගත හැකිය. උඩුනුවර ප්‍රදේශයේ වාර්තාගත රැකියා නියුක්තිය තුළ ආරක්ෂක අංශයට සැලකිය යුතු ස්ථානයක් හිමි වන අතර, යටිනුවර ප්‍රදේශයේ කාර්මික හා කම්කරු රැකියා වඩාත් කැපී පෙනේ. මෙම වෙනස්කම් ප්‍රදේශ දෙකෙහි භූගෝලීය පිහිටීම, ආර්ථික අවස්ථා සහ

සමාජීය තත්ත්වයන් සමඟ සම්බන්ධ කර විග්‍රහ කළ හැකිය. ඒ අතරම, උඩුනුවර පිත්තල, ලී කැටයම්, බෙර නිෂ්පාදනය, කම්මල් වැඩ සහ රිදී වැඩ වැනි සාම්ප්‍රදායික කර්මාන්ත පරම්පරාගත දැනුම හා සංස්කෘතික උරුමය රැකගැනීම සඳහා වැදගත් වේ. එහෙත් සාම්ප්‍රදායික වෘත්තීන් සහ කුල සම්බන්ධතා අතර පැවති ඓතිහාසික බැඳීම් ඇතැම් සමාජ කණ්ඩායම්වල වෘත්තීය තේරීම් හා සමාජ සංචලනය කෙරෙහි බලපා ඇති බව ද සැලකිල්ලට ගත යුතුය. එබැවින් සාම්ප්‍රදායික කර්මාන්ත සංරක්ෂණය කිරීමේදී ඒවාට සම්බන්ධ පරම්පරාගත දැනුම අගය කිරීම මෙන්ම වෘත්තීය නිදහස, සමාන අවස්ථා සහ සමාජ සාධාරණත්වය තහවුරු කිරීම ද වැදගත් වේ.

වර්තමානයේ සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර අතීතයේ පැවති සමීප සබඳතා යම් පමණකට දුර්වල වී ඇති බව අධ්‍යයනයෙන් පෙනී යයි. ආර්ථික කටයුතුවලට වැඩි කාලයක් යොමු කිරීම, ජීවන රටාවේ වෙනස්කම්, පරම්පරා අතර ආකල්පමය පරතරය සහ අන්‍යෝන්‍ය හමුවීම් සඳහා පවතින අවස්ථා සීමා වීම එයට බලපාන සාධක ලෙස හඳුනාගත හැකිය.

දෙනුවර ප්‍රදේශයේ සිංහල-මුස්ලිම් සම්බන්ධතා යනු ඉතිහාසය, සංස්කෘතිය, භාෂාව, ආගම, වෘත්තිය, අධ්‍යාපනය සහ ආර්ථික ජීවිතය යන අංශ රැසක් එකිනෙකට සම්බන්ධ කරන සංකීර්ණ සමාජ ක්‍රියාවලියකි. මෙම අධ්‍යයනය මඟින් හෙළිවන පරිදි, ප්‍රජාවන් අතර සහජීවනය ගොඩනැඟීම සඳහා ඓතිහාසික සමීපතාව පමණක් ප්‍රමාණවත් නොවන අතර, එය වර්තමානයේ ද පවත්වාගෙන යාමට අන්‍යෝන්‍ය ගෞරවය, භාෂාමය අවබෝධය, සමාන අධ්‍යාපනික හා ආර්ථික අවස්ථා සහ පොදු සමාජ අවකාශ ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. ඒ අනුව, දෙනුවර ප්‍රදේශයේ ඓතිහාසික උරුමය සංරක්ෂණය කිරීමත්, සාම්ප්‍රදායික වෛද්‍ය දැනුම හා දේශීය කර්මාන්ත අනාගත පරම්පරාවන් වෙත සම්ප්‍රේෂණය කිරීමත්, සිංහල හා මුස්ලිම් ප්‍රජාවන් අතර අන්තර්සංස්කෘතික සබඳතා වර්ධනය කිරීමත් ප්‍රාදේශීය සංවර්ධනයේ වැදගත් අංග ලෙස පෙන්වා දිය හැකිය. එබැවින් දෙනුවර ප්‍රදේශයේ අනාගත සමාජ සංවර්ධනය සඳහා අතීතයේ පැවති සහජීවන අත්දැකීම් විචාරාත්මකව හඳුනාගෙන, ඒවා වර්තමාන සමාජ අවශ්‍යතා සමඟ සම්බන්ධ කර ගැනීම සුදුසු බව පෙන්වා දිය හැකිය.

පරිශීලන නාමාවලිය

අල්හාජ් හනීෆා, ඊ. ඒ. එම්. (2009). උඩුනුවර මුස්ලිම් ජන ජීවිතය හා සංස්කෘතිය. තිලිණ මුද්‍රණාලය.

උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. (2021). වාර්ෂික වාර්තා දත්ත සම්පත් පැතිකඩ. උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. (2022). වාර්ෂික වාර්තා දත්ත සම්පත් පැතිකඩ. යටිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.

තුන්දෙණිය, එච්. එම්. එස්., සහ ගුණවංශ හිමි, හන්දේසේ. (1987). උඩුනුවර ඉතිහාසය. සුප්‍රා ප්‍රින්ටර්ස්.

වීරකෝන්, ඩබ්. එම්. යු. (2020). අධ්‍යාපනය පිළිබඳ සමාජ විද්‍යාව, නෙත්විත් ප්‍රින්ටර්ස්. ගැටඹේ

හේරත්, ඒ. එම්. සහ බණ්ඩාර, වී.වා.මු.ටී. (2009). ඓතිහාසික යුගයේ සිට මේ දක්වා උඩුනුවර ජන ජීවිතය, ජන ඇදහිලි හා විශ්වාස සමග සංගණන රටාව. තිලිණ මුද්‍රණාලය.

මුහම්මදු හනීෆා, ඉ. ඒ. (2017). උඩුනුවර මුස්ලිම් ජනාවාස ව්‍යාප්තිය. නිශාහින් ප්‍රින්ටර්ස්.

කන්දේගම. වයි. (2009). උඩුනුවර සංස්කෘතික දායාද. තිලිණ මුද්‍රණාලය.

බණ්ඩාර, ටී. එම්. ටී. (2009) උඩුනුවර ප්‍රධාන ආර්ථික සම්පත වූ කෘෂිකර්මය. තිලිණ මුද්‍රණාලය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. (2024). මූලික වාර්තාව: ජන හා නිවාස සංගණනය 2024. මුදල්, ආර්ථික සංවර්ධන, ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය.

Ansaldo, U. (2017). Sri Lanka and South India. In R. Hickey (Ed.), *The Cambridge Handbook of Areal Linguistics*.Cambridge University Press. https://doi.org/10.1017/9781107279872.022

De Silva, A. M. W. (2018). Do name changes to “acaste” names by the Sinhalese indicate a diminishing significance of caste? *Cultural Dynamics, 30*(4), 303–325.

Dewaraja, L. (1994). *The Muslims of Sri Lanka: One Thousand Years of Ethnic Harmony, 900–1915*. Colombo: The Lanka Islamic Foundation

Department of Census and Statistics (DCS), Census of Population and Housing (2012) – Kandy District, Ministry of Finance, Planning and Economic Development.

Department of Census and Statistics. (2025). *Census of Population and Housing – 2024*. Table 6.1.9: Percentage Distribution of the Population by Ethnic Group and Province, 2024, Sri Lanka: Department of Census and Statistics

Department of Census and Statistics, Sri Lanka. (2024). *Census of Population and Housing 2024: Preliminary Report*. Colombo: Department of Census and Statistics

Faculty of Indigenous Medicine, University of Colombo. (2023). *Unani section*. https://fim.cmb.ac.lk/about-unani-section/

Fishman, J. A. (1999). *Language and ethnic identity*. Oxford University Press.

Human Rights Commission of Sri Lanka (HRCSL). *Annual Report 2018: State of Human Rights in Sri Lanka,* Colombo: Human Rights Commission of Sri Lanka

International Crisis Group. (2007, May 29). *Sri Lanka’s Muslims: Caught in the crossfire* (Asia Report No. 134). https://www.refworld.org/reference/countryrep/icg/2007/43084

Jones, M. (2020). *Striving for equity: Healthcare in Sri Lanka from independence to the millennium, 1948–2000*. Orient Blackswan.

Kannangara, A. P. (1984). The riots of 1915 in Sri Lanka: A study in the roots of communal violence. *Past & Present, 102*(1), 130–164. https://doi.org/10.1093/past/102.1.130

Luckman, S., & Thomas, N. (2023). *Craft communities*. Bloomsbury Visual Arts. https://www.scribd.com/document/1061961762/Craft-Communities

Katherine. R. (2020). "Everyday Multiculturalism in the Public Library: Taking Knitting Together Seriously." *Sociology*, 54(3). DOI: 10.1177/0038038519899352

Ministry of Education. (2020). *Annual School Census of Sri Lanka: Final Report—2020*. Ministry of Education

Nanayakkara, K. (2021). *An investigative study of trade relations between Sri Lanka and South India mentioned in Tamil inscriptions of Sri Lanka*. TRIVALENT: Journal of Archaeology, Tourism & Anthropology, 2(2). https://doi.org/10.4038/tjata.v2i2.66

Shukri, M. A. M. (Ed.). (1986). *Muslims of Sri Lanka: Avenues to antiquity*. Jamiah Naleemiah Institute.

Simpson, B., & de Silva, P. (2025). Cultural ambivalence: A socio-historical account of the Berava caste of Southern Sri Lanka. *Caste: A Global Journal on Social Exclusion, 6*. https://journals.library.brandeis.edu/index.php/caste/article/view/2494

Venugopal, R. (2014). Sri Lanka: Military fiscalism and the politics of market reform at a time of civil war. In A. Sundar & N. Sundar (Eds.), *Civil wars in South Asia: State, sovereignty, development* (pp. 69–95). SAGE Publications. https://doi.org/10.4135/9789351508052.n3

Witharana, D. (2019). *Technical education in the imagination of the Ceylonese developmental state: D. J. Wimalasurendra and the Navandanna caste*. Open University of Sri Lanka. https://www.researchgate.net/publication/334568753TechnicalEducationintheImaginationoftheCeyloneseDevelopmentalStateDJWimalasurendraandtheNavandanna_Caste.

World Bank. (1999, August 10). *Sri Lanka: A fresh look at unemployment* (Report No. 19609-CE). Poverty Reduction and Economic Management Unit, South Asia Region. https://documents1.worldbank.org/curated/en/364981468777264355/pdf

World Health Organization & International Labour Organization. (2021). *WHO/ILO joint estimates of the work-related burden of disease and injury, 2000–2016: Global monitoring report*. World Health Organization.